# නර්තනය

# අතිරේක කියවීම් පොත

## 9 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@nie.lk

**නර්තනය**

**9 වන ශ්‍රේණිය**

**අතිරේක කියවීම් පොත**
**(2018 සිට ක්‍රියාත්මක වේ)**

**ප්‍රථම මුද්‍රණය 2018**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

***මුද්‍රණය*** : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් කාලෝචිත ව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබන අතර ඒ ඒ විෂයයන්ට අදාළ ව අතිරේක කියවීම් පොත් සම්පාදනය එහි එක් ප්‍රතිඵලයකි.

ඒ අනුව 6 සිට 13 ශ්‍රේණි විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ පන්ති කාමරය තුළ සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් අතිරේක කියවීම් පොත් සම්පාදනය කර ඇත.

අතිරේක කියවීම් පොත් මඟින් විෂය නිර්දේශයට අදාළ උද්ධෘත ගුරු ශිෂ්‍ය දෙපාර්ශ්වය වෙත සැපයීමෙන් අදාළ විෂය ධාරාව පහසුවෙන් අධ්‍යයනය කිරීමට පහසුකම් සැලසෙනු ඇති බව අපගේ විශ්වාසය යි.

මෙම අතිරේක කියවීම් පොත් පරිශීලනය කොට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගන්නා ලෙස ගුරු භවතුන්ගෙන් ද, සිසු දරු දැරියන්ගෙන් ද ඉල්ලා සිටිමි.

මෙම අතිරේක කියවීම් පොත් ඔබ අතට පත් කිරීම සඳහා ශාස්ත්‍රීය දායකත්වය සැපසූ ආයතනික කාර්ය මණ්ඩලය සහ බාහිර විද්වතුන් වෙත මාගේ කෘතඥතාව හිමි වේ.

ආචාර්ය ජයන්ති ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම නිරතුරු ව ඇගැයීම සමග සම්බන්ධ කළ හැකි ය. ඉහළ ඇගැයීම් සාධනයක් සඳහා අත්දැකීම පුළුල් විය යුතු ය. විහිද ගිය පුළුල් පරාසයක් සහිත ඉහළ ඇගැයීමක හිමිකම සැමට ම උපරිම සතුටක් උරුම කරයි. ඒ සඳහා සේවනයට අදාළ පුද්ගල, ස්ථාන, වස්තු, සිද්ධි බහුල වීම අවශ්‍ය ය.

එසේ ඉගෙනුම් අත්දැකීම් පුළුල් කිරීම සඳහා අතිරේක සම්පත් පොත් සකස් කිරීමට හැකිවීම ජාතික අධ්‍යාපන ආයතනයට සතුටකි. ඒ සඳහා කැප වී ක්‍රියා කළ සැමට අපගේ ස්තුතිය පිරිනැමේ.

ශිෂ්‍ය ප්‍රජාව මෙම අතිරේක සම්පත් පොත පරිහරණය කරමින් එමඟින් ඉදිරිපත් කරන වෙනත් දැනුම් මූලයන් ද සමීප කර ගතහොත් ඉහළ සාධනයක් වෙත ළඟා වීමට හැකි වීම නිසැක ය. එබැවින් ශිෂ්‍ය, ගුරු දෙගුරු, සැමගේ අවධානය යොමු විය යුතු ය. මෙම අතිරේක සම්පත් පොත් තවදුරටත් සංවර්ධනය කිරීමට උක්ත සැමගේ අවධානය යොමු වීම ද අප විසින් අපේක්ෂා කෙරේ. අදාළ යම් කරුණක් වෙතොත් අප දැනුම්වත් කරන ලෙස ඉල්ලා සිටින අතර දැයේ දූ දරුවන්ගේ ඉගෙනුම් පරාසයන් පුළුල් වෙමින් අභිමානවත් දැයක් ගොඩ නැගේ වා' යි ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ හර හෙවත් ප්‍රධාන විෂයයන් ලෙස පිළිගත් මවුබස, ගණිතය, විද්‍යාව වැනි විෂයයන් සඳහා බොහෝ කලෙක සිට විෂය නිර්දේශයට සමගාමී ව ගුරු මාර්ගෝපදේශයට (Teacher Guide) අමතර ව පෙළ පොත් (Text books) භාවිතයේ පවතී. ඒ අනුව ගුරු මාර්ගෝපදේශ ගුරුවරයාට ද, පෙළ පොත සිසු පරිහරණයට ද ලබා දෙමින් සිසුන් තුළ නැණ පහන් ඉතා උසස් ලෙස දල්වන්නට සැවොම ක්‍රියාත්මක වෙති.

අධ්‍යාපන ප්‍රතිපත්ති මඟින් තවමත් හර විෂයයක් ලෙස නො පිළිගත් සෞන්දර්ය විෂයය සුභාෂිත කතු කී ලෙස ''ගුණ නැණ බෙලෙන් යුතු පුතු ම ය ඉතා ගරු'' යන පෙදෙහි 'ගුණ' වඩනට දෙනු ලබනුයේ අද්විතීය දායකත්වයෙකි. නැණ වැඩෙනුයේ විෂය බද්ධ දැනුම හා හැකියා වැඩුම මුල් කොට ය. මිනිසා ගුණවත් නම් මානව යහපැවැත්මට, පරිසරයට සොබා දහමට සංවේදී පුරවැසියෙක් බව හේ චර්යාවෙන් ම පළ කරයි. 'ගුණ' පළමු කොට ද, නැණ ඊට සරිලන පමණින් ද යුතු වූ පුරවැසියකු අද මෙදෙසට වඩාත් අවැසි ය. ඒ ගරු කටයුතු පුරවැසියා තැනුමට නම් සෞන්දර්ය විෂයයන් හර විෂය කුලකයෙහි තබනු වටී. ඒ බැවි බොහෝ කලෙක සිට හඳුනා මෙම විෂය ක්ෂේත්‍රයේ නැඟුම උදෙසා වෙහෙසෙන අපි මෙතෙක් පිළිගැනුමට ලක්ව ඇති හර විෂයයන්ට සේ ම මීට ද සිසු කැල සඳහා පෙළ පොත් නිපදවීමෙහි අගය පෙන්වා දුන්නෙමු. අපි තව මත් ''හර'' නොවන බැවින් ඊට ඉඩකඩක් නො ලද මුත් ගුරුවරයාට ඉගැන්වීමට උපකාරක අත්පොතක් ලෙස මෙවන් පොතක් පද්ධතියට පිළිගැන්වීමට නම් ඉඩ ප්‍රස්තාව ලදිමු. මින් ඉටු වනුයේ පෙළ පොතෙහි කාර්යභාරය ම නො වන මුත් මෙය සිසු පසට ද, ගුරු පසට ද, ඉමහත් ශක්තියක් හා ජාතික වශයෙන් සම්මත, සමපාත බවක් ඇති කිරීමට නොමඳ ඵලදායක සම්පතක් වනු ඇත.

පන්තිකාමරයට හරවත් වූ මෙම ඉගෙනුම් සම්පත හෙට දවසේ පද්ධති ගත කිරීමෙන් අප සපුරා ගන්නට අපේක්ෂිත සුවිශේෂ ඵල මෙසේ වේ.

1. ගුරුවරයාට අත්‍යවශ්‍ය විෂය කරුණු එක ගොනුවක් කොට සපයා දීමෙන් ගුරු කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
2. ගුරු මාර්ගෝපදේශයෙහි සවිස්තරාත්මක ව ඉදිරිපත් නො කෙරෙන විෂය අන්තර්ගතය මෙම පොත ඇසුරින් ලබාදීම.
3. ගුරු මාර්ගෝපදේශය ප්‍රමාණයෙන් පිටු විශාල ගණනකට යාම වැළැක්වීම හා ඊට අත්‍යවශ්‍ය ම කරුණු පමණක් ඇතුළත් කිරීම.
4. මතභේදයන්ට තුඩු දෙන විෂය කරුණු වෙතොත් ඒ පිළිබඳ ජාතික වශයෙන් ඒකමතික භාවයක් ඇති කිරීමට අවශ්‍ය නිශ්චිත කරුණු/තර්ක සම්පාදනය කිරීම.
5. විෂය කරුණුවල සමතුලිත බව හා සීමා නිර්ණයන්හි ප්‍රමිති ගත බව ඇති කිරීමෙන් ඇගැයීම් කාර්ය පහසු කරවීම.
6. ගුරුවරයාගේ දැනුම නිර්දේශයෙන් මඳක් ඔබ්බට ප්‍රසාරණය කරමින් විෂයානුබද්ධ දැනුම පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කිරීම.
7. ගුරු සිසු දෙපිරිසට ම ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලිය රසවත් හා හරවත් අත්දැකීමක් බවට පත් කිරීම.

ඒ සා ඉමහත් සම්පතක් ලෙස මෙම පොත අප දෙස දරු කැලගේ යහ ගුණ නැණ වඩන්නට මෙන් ම රසවත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගන්නට ගුරු ඔබට පිහිට වනු ඇත. ගුරු ඔබේ ක්‍රියාශීලී බව හා දැනුම්වත් බව මින් තව තවත් වැඩේ වා! එමෙන් ම වත්මන් දරු කැලට සෞන්දර්ය විෂයය ඉගෙනුම රසවත් හා හරවත් ජීවිත අත්දැකීමක් වේ වා! යි මම පතමි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ/බ)
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය** : ආචාර්ය ටි .ඒ.ආර්.ජේ.ගුණසේකර මහත්මිය.
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

: ශාස්ත්‍රපති සුදත් සමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ. බ.)
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : එස්. වර්ණසිංහ
අධ්‍යක්ෂ (වැ. ආ.)
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : බී. මරීනා ශිරාන්ති ද සොයිසා
කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය**
**අභ්‍යන්තර** : එස්. වර්ණසිංහ - අධ්‍යක්ෂ (වැ. ආ.)
බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ - ජ්‍යෙ. කථිකාචාර්ය
බී. මරීනා ශිරාන්ති ද සොයිසා - කථිකාචාර්ය

**බාහිර** : සිරිල් මීගම - ජ්‍යෙ. කථිකාචාර්ය (විශ්‍රාමික)
සෞන්දර්ය අධ්‍යාපන ගුරු විදුහල, ගිරාගම
සමන් පෙරේරා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කැලණිය
කේ සුසන්ත ගුණවර්ධන -සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - දෙනුවර අධ්‍යාපන කලාපය
යූ. ජී. ප්‍රේමරත්න- සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - හලාවත අධ්‍යාපන කලාපය (විශ්‍රාමික)
දම්මික් ප්‍රනාන්දු - ගුරු උපදේශක හා විෂය සම්බන්ධීකාරක
කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතරකේ.
එල්.ඒ. ධර්මලතා මිය.ගුරු උපදේශක-
කලාප අධ්‍යාපන කාර්යාලය - දෙහිඕවිට.

එම්. හේවාවිතාරණ
ගුරු සේවය - බ.ප. විද්‍යාකර බාලිකා විද්‍යාලය - මහරගම
එම්.එම්.එස්.පී.කේ. මාරසිංහ
ගුරු සේවය - හංවැල්ල රාජසිංහ ම.ම. විද්‍යාලය - හංවැල්ල

**විෂය සංස්කාරක මණ්ඩලය** : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අසෝකා දිසානායක
ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුනිලා රූපස්සර
සෞන්දර්ය කලා වි.වි. - කොළඹ 07

**භාෂා සංස්කරණය** : ශ්‍රීනාත් ගණේවත්ත - භාෂා සංස්කාරක

**කංචුක නිර්මාණය** : ඊ.එල්.ඒ.කේ. ලියනගේ මහතා
ජාතික අධ්‍යාපන ආයතනය

**පරිගණක වදන් සැකසුම**: ඩී.සී. ජයකොඩි මහත්මිය
ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහාය** : දීපා ශිරෝමණී මෙණෙවිය
කේ.ජී. පෙරේරා මහතා
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


පිටුව

**අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය** i
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය** ii
**හැඳින්වීම** iii
**ලේඛක මණ්ඩලය** iv - v
**පටුන** vi

**1 පරිච්ඡේදය**
1.0 පරිසරය ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය 1

**2 පරිච්ඡේදය**
2.0 නර්තන ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය 9

**3 පරිච්ඡේදය**
3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ 27

**4 පරිච්ඡේදය**
4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම හා ගායනය 32

**5 පරිච්ඡේදය**
5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම 34

**6 පරිච්ඡේදය**
6.0 කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් 42

**7 පරිච්ඡේදය**
7.0 අත්දැකීම් ඇසුරු කරගනිමින් ප්‍රාසංගික කලාංග නිර්මාණය 51

**8 පරිච්ඡේදය**
8.0 ශාරීරික ස්වස්ථතාව පවත්වාගැනීමේ වටිනාකම 58

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 60

# 1 පරිච්ඡේදය

## 1.1 පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණය

සැම නිර්මාණයක් ම අප අවට පරිසරයේ පවතින්නා වූ විවිධ සාධකයන් ඇසුරින් ගොඩ නැඟී ඇත. ඒ අනුව චරිත නිරූපණයේදී කවර හෝ චරිතයකට අයත්, බාහිර චර්යාවන් අනුකරණය සිදු වුව ද චරිත සඳහා නර්තන නිර්මාණය සංකීර්ණ වූ කාර්යයකි.

අප අවට පරිසරයේ දක්නට ලැබෙන විවිධ චරිත ප්‍රභේද අතුරින් මනුෂ්‍ය චරිත විශේෂ වේ. ඒවායේ එකිනෙකට වෙනස් චරිත ලක්ෂණ රැසක් හඳුනාගත හැකි ය.




මේ ආදී වශයෙන් එකිනෙකට බොහෝ අසමාන ලක්ෂණ පෙන්නුම් කරන චරිත අසීමිත සංඛ්‍යාවක් චරිත අප අවට පරිසරයෙහි විද්‍යමාන වේ. මේ සැම චරිතයකට ම බාහිරින් ප්‍රකාශ වන ලක්ෂණ මෙන් ම ආභ්‍යන්තරික ගති ස්වභාව ද ඇත. එබැවින් චරිත ඇසුරින් නර්තන නිර්මාණය මනා අවබෝධයෙන් යුතු ව සිදු කළ යුතු විධිමත් රංග කාර්යයකි.

මනුෂ්‍ය චරිත ඇසුරින් නර්තන නිර්මාණයේ දී නිර්මාණ ශිල්පියා විසින් විශේෂයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ චරිතය මඟින් බාහිර ව ප්‍රදර්ශනය කරනු ලබන ක්‍රියාකාරකම් ය. එබැවින් මෙහි දී නිරීක්ෂණය ඉතා ම වැදගත් කාර්යයකි. මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණයේ දී අනුගමනය

කළ යුතු පළමු පියවර වන්නේ නිරීක්ෂණය මඟින් අදාළ චරිතය පිළිබිඹු කරවන බාහිර ගති ස්වභාවයන් හඳුනාගැනීම ය. එහිදී චරිතයේ අභ්‍යන්තර ගති ස්වභාවයන් ද අනුගමනය කිරීම මඟින් සැබෑ ස්වරූපය ප්‍රකාශනය සඳහා පහසුවන බව දැක්විය යුතු ය.භාව ප්‍රකාශනය වඩාත් තිව්‍ර කරමින් නර්තන නිර්මාණය සාර්ථක කිරීමට හැකි වනු ඇත.

- නිරීක්ෂණය සඳහා අවධානය යොමු කළ යුතු කරුණු
    - ගමන් විලාස හා බැඳි විවිධතා .
    - අංග, ප්‍රත්‍යංග, උපාංග ආදියෙහි ක්‍රියාකාරී ස්වභාවය.
    - භාව ප්‍රකාශනය.

ඉහත ලක්ෂණ නිරීක්ෂණය කරමින් එහි විවිධතා හා සුවිශේෂතා හඳුනාගැනීම වැදගත් වේ.

එසේ ම නර්තන නිර්මාණයේ දී ඒ ඒ අවස්ථාවට උචිත තාලානුකූල චලන,රිද්මානුකූල චලන හා ප්‍රකාශනාත්මක චලන යොදා ගැනීම පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. ඉහත කී කරුණු පදනම් ව මෙම චරිත ලක්‍ෂණ නිරීක්ෂණය කළ යුතු ව ඇත.

- ධීවරයා
- කුඹල්කරු
- ගොවියා
- තේ දළු නෙළන්නිය

ආදි විවිධ මිනිස් චරිත සඳහා ආවේණික වූ චරිත ලක්ෂණ ඇති වුව ද ඔවුන්ගේ ක්‍රියාකාරකම් අතර සමානත්වයක් නැත. එසේ වුව ද අප විසින් හඳුනාගත යුතු වන්නේ නර්තන මාධ්‍යයෙන් නිරූපණය කළ හැකි බාහිර ව ප්‍රකාශ වන චරිතයෙහි අනන්‍යතාව දක්වන ඉරියව් වේ. ඒවා නිවැරදි ව නිරූපණය කිරීම මඟින් චරිතයෙහි ස්වභාවය ප්‍රතිනිර්මාණය කළ හැකි ය.
ඒ සඳහා අප පහත සඳහන් ක්‍රියා පිළිවෙත් අනුගමනය කළ යුතු ය.

- පරිසර නිරීක්ෂණයේ දී ලබන අත්දැකීම් ඇසුරු කර ගැනීම.
- විවිධ ජීවන වෘත්තීන් පිළිබඳ ස්වභාවය අවධාරණය කිරීම.
- නර්තනය මාධ්‍යය කොටගෙන චරිත නිරූපණය කිරීම.
- නර්තන නිර්මාණයේ දී තාලය, රිද්මය හා ප්‍රකාශනය කෙරෙහි අවධානය යොමු කිරීම.
- භාවමය හැඟීම් උද්දීපනය වන සේ නර්තන නිර්මාණය.
- චලන හා අවකාශ භාවිතය පිළිබඳ අවබෝධය.
- නර්තන නිර්මාණයේ දී බෙර වාදනය සංගීතය උපයෝගී කර ගැනීම.

- **චරිත නිර්මාණයට සුදුසු සිද්ධියක් ගොඩ නැඟීම**

චරිත නිර්මාණයට සුදුසු සිද්ධියක් ගොඩනගා ගැනීමේ දී එහි තාල හා රිද්ම අනුගමනය කරමින් සුදුසු චලන යොදා නර්තන නිර්මාණය කිරීමට හැකි වීම පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

- මුහුදු යන්නට සැරසෙන ධීවරයා.
    - ආගමික ඇදහීමෙන් පසු රැගෙන වෙරළට ගොස් ඔරුව දියත් කිරීම.
    - විවිධාකාරයෙන් හබල් ගසා ඔරුව දියඹට ගෙන යාම.
    - දැල් රැගෙන ඈතට එළීම සිදු කර ඒවා ආපසු ඇද මත්ස්‍ය සම්පත ලබා ගැනීම.
    - අවසානයේ දී ඔරුව නැවත ගොඩට ගෙන ඒම

- පසු ව වෙරළේ විශාල දැලක් අදිමින් සිටි කණ්ඩායමට එකතු වී දැල ඇදීම

- විශාල මත්ස්‍ය ප්‍රමාණයක් අසු වී සිටිනු දැක සතුටින් නැටීම ආදිය ගත හැකි ය.

ඉහත සිද්ධියට අදාළ සුදුසු චලන යොදා නර්තන නිර්මාණය සිදු කල හැකි අවස්ථා හඳුනාගත හැකි ය.

1. සූදානම් වීම
2. වෙරළෙහි ඇති ඔරුව මුහුදට දියත් කිරීම

   මෙහි දී පාද තැබීම, හස්ත චලනය සමග ශරීරය හැසිරවීම යන ක්‍රියාකාරකම් තුල ශක්තිමත් ස්වරූපයක් පිළිබිඹු වේ. එහිදී තාලානුකූල, රිද්මයානුකූල චලන යොදා ගනිමින් නර්තන නිර්මාණ කළ හැකිය. චලන හා ශරීර ස්වභාවයන්හි විවිධ වෙනස්කම් ඉස්මතුවන පරිදි භාව ප්‍රකාශනය යොදා ගනිමින් නර්තන නිර්මාණය වඩාත් තීව්‍ර වනු ඇත.

3. විවිධ දිසා හා කෝණ අනුව හබල් ගැසීම

   මෙහි දී ක්‍රමයෙන් තාලානුකූල ව හබල් භාවිතය හසුරුවා ගනිමින් ගමන් කිරීම. එකතු කරමින් ඉදිරියට තැබීම, ගමනේ යෙදීම ප්‍රකාශනය වේ.

4. දැල රැගෙන මුහුදට එළීම හා නැවත ගොඩට ඇදීම

   දැල මුහුදට විසිකිරීමේදී සිරුර ඉදිරියට ඇදීයන පරිදිත් , දැල ඇදීමේදී සිරුර පිටුපසට එන පරිදිත් චලන හැසිරවිය යුතුය.

5. ඔරුව නැවත ගොඩබිමට ගැනීම

   පාද සමබර ව ක්‍රමයෙන් තබා ගැනීම පිළිබිඹු කළ යුතු ය.

6. දැල් ඇදීමේ ස්වභාවය අනුකරණය

   - දෑත ඉදිරිපසට හා පසුපසට මාරුවෙන් මාරුවට තැබීම
   - පාද සමබර ව දෑතට සරිලන පරිදි තබා ගැනීම
   - ශරීරය ඉදිරිපස සිට පසුපසට ඇද ගැනීම
   - එක් ඇදිල්ලකින් පසු ව ශරීර ඉරියව්ව මාරු කිරීම

ආදි චලන ලක්ෂණ මෙහි අන්තර්ගත විය යුතු ය.

තාලානුකූල, රිද්මානුකූල හා ප්‍රකාශනාත්මක චලන භාවිතයෙන් නර්තන නිර්මාණය සාර්ථක කර ගත හැකි ය.

ඉහත ලක්ෂණ මඟින් නර්තන නිර්මාණයේ දී පැහැදිලි වන කරුණු කිහිපයකි.

චරිත ඇසුරින් නර්තන නිර්මාණයේ දී ඒ ඒ චරිතයට අදාළ ස්වරූපයන් සම්පූර්ණයෙන් වෙනස් ය.

- යොදා ගන්නා චලන ලක්ෂණ එකිනෙක වෙනස් වීම
- ශක්තිය, කාලය, වේගය මෙන්ම තල දිසා හා සම්බන්ධතා විවිධාකාර යොදා ගැනීම
- මනුෂ්‍ය චරිතයට අදාළ නියමිත ගති ලක්ෂණ නර්තනය මඟින් පිළිබිඹු වීම
- සැම විට ම එකිනෙක චරිත සඳහා නර්තන නිර්මාණයේ දී චලන විවිධතා තිබීම

ඉහත සඳහන් චරිතයන්හි සුවිශේෂ අවස්ථා ගෙන ඒ සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් අනුව පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| චරිතය | අදාළ ක්‍රියාකාරකම් | කාලය හා ලය | උපකරණ හැසිරවීමේ අවස්ථා |
|---|---|---|---|
| | | | |

# 1.2 භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපණය

## ශෝකය නමැති ස්ථායි භාවය නිරූපණය

අප අවට පරිසරය තුළ ජීවත්වන විවිධ පුද්ගලයන්ගේ හැසිරීම් පිළිබඳ ව හොඳින් නිරීක්ෂණය කිරීම මඟින් විවිධ අත්දැකීම් ලබාගත හැකි ය. පුද්ගලයන් අතර හැසිරීම් රටා, කථා විලාස, ගමන් රටා හා ශරීර ස්වභාවයන්හි විවිධ වෙනස්කම් දක්නට ඇත. මේ අනුව තම තමන්ට ආවේණික විවිධ හැසිරීම් රටාවන් ඇති බව මින් අනාවරණය වේ.

මෙවැනි හැසිරීම් රටා ඇති චරිත නිරීක්ෂණය කිරීමට රස හා භාව පිළිබඳ අධ්‍යයනය කිරීම කළ යුතු ය. මීට පෙර ඔබ 8 ශ්‍රේණියේ දී ඉගෙන ගත් ''භය'' නමැති ස්ථායි භාවය මඟින් භයානක රසය නිරූපණය කළ අයුරු මතකයට නගා ගන්න. ඒ මතකය මඟින් ශෝක භාවය පිළිබඳ විමසා බලමු. සිත කම්පා කරන සිදුවීමක් දැකීම එවැනි සිද්ධියක් අසන්නට ලැබීම හා තමා සමග සමීප ව සිටි කෙනෙකු වියෝ වීම වැනි අවස්ථාවන් නිසා ශෝක නමැති ස්ථායි භාවය උපදින බව උදාහරණ ලෙස පෙන්වා දිය හැකි ය.



ශෝක භාවය දැක්වෙන රූපයක්

ඉහත දැක්වෙන රූපය හොඳින් නිරීක්ෂණය කිරීමෙන් මුහුණේ ඇති ඉන්ද්‍රියයන්හි සිදුවන වෙනස් වීම් හඳුනාගත හැකි ය. එසේ හඳුනාගත් වෙනස් වීම් මෙසේ ලියා දක්වමු.

- දෑස් අඩවන් වීම
- නළල යම් ප්‍රමාණයකට රැළි වැටුණු ස්වරූපයක් ගැනීම
- කම්මුල් හැකිළීම
- කඳුළු සැලීම

ඉහත ලක්ෂණ ඉස්මතු වන පරිදි පහත ඇති සිද්ධිය නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන්න.
සුපුන්ගේ සහ නදීගේ ගෙදර සුරතලා 'බන්ටි' නමින් වූ බලු පැටියෙකි. බන්ටිට අසනීප විය. දිනක් පාසල ඇරී ගෙදර එන සුපුන්ට දැනගන්නට ලැබුණේ බන්ටිට ඉතා අසාධ්‍ය බවයි. එය ඇසූ සුපුන් බන්ටි ළඟට විත් උපස්ථාන කරන්නට විය. ටික වේලාවකට පසු ව ඉතා අමාරුවෙන් හුස්ම ගත් බන්ටිගේ හුස්ම ගැනීම නතර විය. බන්ටි අපෙන් සදා සමු ගත් බව දැන ගත් සුපුන් හඬන්නට වූයේ මවට තම දුක පවසමිනි.

මීට ගැළපෙන වෙනත් සිදුවීම් හා කතා පුවත් තෝරා ගත හැකි ය.

- ඔරුවක නැඟී මුහුදු ගිය තම පුතා එනතුරු වෙරළට වී මව බලා සිටියි. (ඔරුව පෙරළී පුතු මිය ගිය බව ආරංචි වීමේ සිද්ධිය)
- දරුවා සමඟ කැලයට දර කඩන්නට ගිය මවට දරුවා සොයා ගැනීමට නොහැකි ව අසරණ වීමේ සිද්ධිය)

කාර්ය පත්‍රිකාව

- ශෝකය නමැති ස්ථායි භාවය නිරූපණය කළ හැකි අවස්ථා නම් කරන්න.
- ශෝකය නමැති ස්ථායි භාවයෙන් උපදින රසය නම් කරන්න.
- එම ස්ථායි භාවය නිරූපණය කළ හැකි සිද්ධියක් ගොඩනඟන්න.
- ශෝකය නමැති ස්ථායි භාවය ප්‍රදර්ශනය කරන්න.

## 1.3 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණය

### ගොයම් නැටුම



ගැමි නැටුමක් ලෙස හඳුන්වන ගොයම් කැපීමේ නැටුම අතීතයේ සිට වී ගොවිතැන හා සම්බන්ධ ක්‍රියාකාරකම් අලළා විනෝදාස්වාදය අරමුණු කොට ගෙන නිර්මාණය වූවකි. ගොයම් කැපීමේ දී දැකැත්තක් අතැති ව විවිධ හැඩතල, රටා මතු කරමින් නර්තනයේ යෙදීම චමත්කාර වේ. සාමූහික ගැමි නැටුමක් වන ගොයම් කැපීමේ නැටුම වර්තමානයේ ප්‍රසංග වේදිකාවට උචිත පරිදි නිර්මාණය කොට ඇත.

ගොයම් කැපීමේ නැටුම නිර්මාණය කිරීම

- සුවිශේෂ ලක්ෂණ ඉස්මතු වන පරිදි උචිත චලන තෝරාගැනීම
- ගොයම් කැපීමට උචිත පරිදි සරල පද නිර්මාණය කිරීම
- දෑ කැත්ත නිවැරදි ව හසුරුවමින් ගොයම් කැපීමේ ස්වභාවය විදහා දක්වෙන පරිදි නර්තනය කිරීම
- තෝරා ගත් කවි ගායනයේ ගති ලක්ෂණය උචිත පරිදි නර්තනය යොදා ගැනීම
- විවිධ තාලවලට අයත් කවි, බෙර පද හා ලයමාන යොදා ගැනීම මඟින් කලාත්මක නිර්මාණ ඉදිරිපත් කිරීම
- රටා හැඩතල යොදා ගනිමින් කණ්ඩායමක් වශයෙන් සහයෝගයෙන් සුදුසු චලන ක්‍රියාකාරකම් යොදාගැනීමය.
- සාමූහිකව සුදුසු පද යොදා ගායනයට වාදනයට අනුව අභ්‍යාස කිරීම මඟින් ප්‍රාසංගික නර්තන අංගයන් නිර්මාණය කර ගත හැකි ය.

කාර්ය පත්‍රිකාව

1. ගොයම් කැපීමේ සුවිශේෂ ලක්ෂණ 3ක් නම් කරන්න.
2. ගොයම් කැපීමේ නැටුමට සුදුසු සරල පද නිර්මාණය කරන්න.
3. කවි හා බෙර පද අනුව ප්‍රාසංගික අංගයක් ඉදිරිපත් කරන්න.

පන් නෙළීම



පහතරට ශාන්තිකර්මවල දී පැදුරේ උපත පිළිබඳව කියැවෙන කවි ගායනා දක්නට ලැබෙන අතර උඩරට සොකරි නාටකයෙහි එක් අවස්ථාවක් ලෙස පන් නෙළීම දැක්විය හැකි ය. ගුරුවාට විඩාව හැර ගැනීමට පැදුරක් ඉල්ලූ අවස්ථාවේ පැදුරක් නොතිබූ හෙයින් විලකට ගොස් පන් උදුරා ගෙනැවිත් පැදුරක් වියා ගන්නා අයුරු අනුරූපණයෙන් දක්වයි.

උදා ඃ- වියා පැදුර පන් කපමින් ගෙන එවිට
මෙයාකාර පැදුරක් දුටුව ද ඇසට
කියා පැදුර අරගෙන ඇවිදින් ළඟට
වියා පැදුර එළුවේ ගුරු හාමින්ට

ගැමි නැටුමක් ලෙස හඳුන්වන පන් නෙළීමේ නැටුම ඈත අතීතයේ සිට පැවැති විනෝදාස්වාදය සඳහා නිර්මාණය වූවක් බව කිව හැකි ය.

- පන් නෙළීමේ ක්‍රියාවලිය ඉස්මතු වන පරිදි උචිත චලන තෝරා ගැනීම
- නැටුමට උචිත සරල පද නිර්මාණය කිරීම
- අන්‍ය අදහස්වලට ගරු කරමින් සාමූහික ව පද නිර්මාණය කිරීම
- හැඩතල රංග රටා මෝස්තර භාවිතය
- පන් නෙළීමේ කවි ගායනයන්හි ගති ස්වභාවයට උචිත වන පරිදි චලන නිර්මාණය කිරීම
- පන් කැපීමට ගන්නා උපකරණ භාවිත කරමින් නැටීම

පන් නෙළීමේ නැටුම නිර්මාණය කිරීම

- පන් නෙළීමේ නැටුමෙහි සුවිශේෂ ලක්ෂණ ඉස්මතු වන පරිදි උචිත චලන තෝරා ගැනීම
- එකිනෙකාගේ අදහස් හුවමාරු කර ගනිමින් ගායන නාද මාලාවට ගැළපෙන පද නිර්මාණය කිරීම
- විවිධ තාලවලට අයත් කවි බෙර පද යොදා ගැනීම මඟින් කලාත්මක නිර්මාණයක් ඉදිරිපත් කිරීම
- හැඩතල, රංග රටා, මෝස්තර භාවිත කරමින් අලංකාර නර්තන අංගයන් ඉදිරිපත් කිරීමට සැලකිලිමත් වීම
- අවකාශ භාවිතය සැලකිල්ලට ගෙන නර්තන අංගයන්හි අලංකාරය තීව්‍ර කර ගැනීම
- ගායනය වාදනය යොදාගනිමින් කණ්ඩායම් සහයෝගයෙන් යුතු ව අභ්‍යාසයෙහි යෙදීම
- නර්තනයට අදාළ උපකරණ නිවැරදි ව භාවිත කරමින් ප්‍රාසංගික නර්තන අංගයන් ඉදිරිපත් කිරීම

ක්‍රියාකාරකම

- පත් නෙළීමේ සුවිශේෂ ලක්ෂණ හඳුන්වන්න.
- නිර්මාණය කරගන්නා ලද නර්තනය ප්‍රාසංගික ව ඉදිරිපත් කරන්න.
- පත් නෙළීමේ නැටුමේ ගායනය, චලනවල උචිත බව, උපකරණ භාවිතය, අවකාශ භාවිතය, රංග රටා, නිර්මාණාත්මක බව යන කරුණු ඔස්සේ විචාරයට ලක් කරන්න.

# 2 පරිච්ඡේදය

## 2.1 උඩරට - පා සරඹ

**දස වන පා සරඹය (උඩරට)**

සරඹ නාමය : තුන්පැති අඩිය

සරඹ පදය : තෙයියත් තෙයිතා තිත්තෙයි තත්තා

තාලය : මහ තනි තිත (මාත්‍රා 4 තාලය)

| | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 |
|---|---|---|---|---|
| සම ගුණ | තෙයි - යත් - | තෙයි - තා - | තිත් - තෙයි - | තත් - තා - |
| දෙගුණ | තෙයි යත් තෙයි තා- | තිත් තෙයි තත් තා- | තෙයි යත් තෙයි තා- | තිත් තෙයි තත් තා- |

පළමුවෙන් පදය තාල තබමින් කීම වැදගත් වේ. මෙහි දි තාල තැබීම සඳහා තාලම්පට භාවිත කළ යුතු ය. පළමුවෙන් ගුරුවරයා නිවැරදි ව නර්තනය කර පෙන්වීමෙන් පසු නිවැරදි අංගහාර හඳුනාගෙන අභ්‍යාස කළ හැකි ය. ( සමගුණ, දෙගුණ යන ලයවලට අභ්‍යාස කිරීම වැදගත් වේ)

**එකොළොස් වන පා සරඹය (උඩරට)**

සරඹ නාමය : චක්‍ර අඩිය

සරඹ පදය : තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්

තාලය : මැදුම් තනි තිත ( මාත්‍රා 3 තාලය)

| | 1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3 |
|---|---|---|---|---|
| සම ගුණ | තෙයි - ත | තෙයි - ත | තෙයි - තෙයි | යත් තාම් - |
| දෙගුණ | තෙයි තතෙ යිත | තෙයි තෙයියත් තාම් | තෙයි තතෙ යිත | තෙයි තෙයියත් තාම් |

**දොළොස් වන පා සරඹය (උඩරට)**

සරඹ නාමය : සුරල් අඩිය

සරඹ පදය : තෙයිතක තෙයිතක තෙයිතක තෙයි

තාලය : මහ තනි තිත (මාත්‍රා 4 තාලය)

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දෙගුණ | තෙයි | - | ත | ක | තෙයි | - | ත | ක | තෙයි | - | ත | ක | තෙයි | - | - | - |
| සම ගුණ | තෙයි | තක | තෙයි | තක | තෙයි | තක | තෙයි | - | තෙයි | තක | තෙයි | තක | තෙයි | තක | තෙයි | - |

**හමාර කිරීමේ පදය**

පා සරඹයක් අවසානයේ නටනු ලබන හමාර පදය සෑම පා සරඹයකට ම පොදු ය.

හමාර පදය : තෙයියත් තෙයියත් තෙයියත් තාම්

තෙයි තාම් තෙයි තෙයි තත් තත් තා

## 2.1.2 පහතරට පා සරඹ

10 වන පා සරඹය : තෙයියත් තරිකිට

තෙයියත් දිගතම්

තාලය : මහ තනි තිත

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දෙගුණ | තෙයි | - | යත් | - | ත | රි | කි | ට | තෙයි | - | යත් | - | දිගතම් | | | |
| සම ගුණ | තෙයි | යත් | තරි | කිට | තෙයි | යත් | දිගතම් | - | තෙයි | යත් | තරි | කිට | තෙයි | යත් | දිගතම් | - |

11 වන පා සරඹය : තෙයියත් කිටි තක

ගුහි තිග දිරි කිට

මාත්‍රා 4 තාලය (මහ තනි තිත)

| | 1´ | 2 | 3´ | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම ගුණ | තෙයි | - | යත් | - | කි | ටි | ත | ක | ගු | හි | ති | ග | දි | රි | කි | ට |
| දෙගුණ | තෙයි | යත් | කිටි | තක | ගුහි | තිග | දිරි | කිට | තෙයි | යත් | කිටි | තක | ගුහි | තිග | දිරි | කිට |

12 වන පා සරඹය : තෙයි ගදිත ගත

තත් දිත් තොං නං

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම ගුණ | තෙයි | - | - | ග | දි | ත | ග | ත | තත් | - | දිත් | - | තොං | - | නං | - |
| දෙගුණ | තෙයි | -ග | දිත | ගත | තත් | දිත් | තොං | නං | තෙයි | -ග | දිත | ගත | තත් | දිත් | තොං | නං |

සබරගමු - මණ්ඩි පද

10. වන සරඹය - **තත් ජිජි ගත**
**තක ජිජි ගත**
**තත් ජින් තත් කුන් දත්**
**තක ජිත් තත් කුන් දත්**

| | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තත් | - | ජි | - | ජි | - | ග | - | ත | - | - | - | ත | ක | ජි | - |
| | ජි | - | ග | - | ත | - | - | - | තත් | - | ජිත් | - | තත් | - | කුං | - |
| | දත් | - | - | - | ත | ක | ජිත් | - | තත් | - | කුං | - | දත් | - | - | - |
| දෙගුණ | තත් | ජි | ජි | ග | ත | - | තක | ජි | ජි | ග | ත | - | තත් | ජිත් | තත් | කුං |
| | දත් | - | තක | ජිත් | තත් | කුන් | - | දත් | | | | | | | | |

11.වන සරඹය - **කිට තරිකිට ගතත්// කිට තරිකිට///ගතත්**

| | ´1 | 2 | 3 | ´1 | 2 | 3 | ´1 | 2 | 3 | ´1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම ගුණ | කිට | තරි | කිට | ග | තත් | - | කිට | තරි | කිට | ග | තත් | - |
| | කිට | තරි | කිට | කිට | තරි | කිට | කිට | තරි | කිට | ග | තත් | - |
| දෙගුණ | කිට | තරිකිට | ගතත් | කිට | තරිකිට | ගතත් | කිටතරි | කිටකිට | තරිකිට | කිට | තරිකිට | ගතත් |

12. දිරිකිට තරිකිට ගත කුකුදත්// දිරිකිට තරිකිට ගත/// කු - කු -දත්///

| | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | දිරි | කිට | තරි | කිට | ග | - | ත | - | කු | - | කු | - | දත් | - | - | - |
| | දිරි | කිට | තරි | කිට | ග | - | ත | - | කු | - | කු | - | දත් | - | - | - |
| | දිරි | කිට | තරි | කිට | ග | - | ත | - | දිරි | කිට | තරි | කිට | ග | - | ත | - |
| | දිරි | කිට | තරි | කිට | ග | - | ත | - | කු | - | කු | - | දත් | - | - | - |
| | කු | - | කු | - | දත් | - | - | - | කු | - | කු | - | දත් | - | - | - |
| දෙගුණ | දිරිකිට | තරිකිට | ග | ත | කු | කු | දත් | - | දිරිකිට | තරිකිට | ග | ත | කු | කු | දත් | - |
| | දිරිකිට | තරිකිට | ග | ත | දිරිකිට | තරිකිට | ග | ත | දිරිකිට | තරිකිට | ග | ත | කු | කු | දත් | - |
| | කු | කු | දත් | - | කු | කු | දත් | - | | | | | | | | |

## 2.2 උඩරට ගොඩ සරඹ හඳුනා ගැනීම

### 7 වැනි ගොඩ සරඹය

සරඹ නාමය : අංගහාර සරඹය
පදය : දොම්කිට කිට දොම්
කස්තිරම : රුංතක,ජිංතක තරිකිට කුන්දත්///
තාග් ගජිංතක තරිකිට කුන්දත් //
රුංතක ජිං ජිං //
රුංතක ජිංතක තරිකිට කුන්දත් තා

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම ගුණ | දො | මි | කි | ට | කි | ට | දොම් | - | දො | මි | කි | ට | කි | ට | දොම් | - |
| දෙගුණ | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් |
| කස්තිරම | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් | තා- | ග්ග | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| | තා- | ග්ග | ජිං | තක | තරි | කිට | කුං | දත් | රුං | තක | ජිං | ජිං | රුං | තක | ජිං | ජිං |
| | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් | තා- | | | | | | | |

### 8 වැනි ගොඩ සරඹය

සරඹ නාමය : අර්ධ චක්‍ර සරඹය
පදය : දොම් කිට කිට දොම්
කස්තිරම : රුංතක ජිංතක තරිකිට කුං දත්///
තාග ජිං තක තරිකිට කුං දත් //
රුං තක ජිං ජිං //
රුං තක ජිං තක තරිකිට කුඳ කුඳ
තාග ජිං තක තරිකිට කුං දත්
රුං තක ජිං තක තරිකිට කුං දත් තා

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම ගුණ | දො | මි | කි | ට | කි | ට | දොම් | - | දො | මි | කි | ට | කි | ට | දොම් | - |
| දෙගුණ | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් |
| කස්තිරම | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් | තා- | ග්ග | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| | තා- | ග්ග | ජිං | තක | තරි | කිට | කුං | දත් | රුං | තක | ජිං | ජිං | රුං | තක | ජිං | ජිං |
| | රුං | තක | ජිං | තක | තරි | කිට | කුඳ | කුඳ | තා | ග්ග | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් | තා | - | | | | | | |

**9 වැනි ගොඩ සරඹය**

සරඹ නාමය : දෑත පෑගීමේ සරඹය

පදය : දොමි කිට/// කිට දොම්

කස්තිරම : තකට තකට තක තරිකිට කුංදත් ///ගජිං

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | දො | මි | කි | ට | දො | මි | කි | ට | දො | මි | කි | ට | කි | ට | දොම් | - |
| දෙගුණ | දොමි | කිට | දොමි | කිට | දොමි | කිට | කිට | දොමි | දොමි | කිට | දොමි | කිට | දොමි | කිට | කිට | දොමි |
| කස්තිරම | තක | ටත | කට | තක | තරි | කිට | කුං | දත් | තක | ටත | කට | තක | තරි | කිට | කුං | දත් |
| | තක | ටක | කට | තක | තරි | කිට | කුං | දත් | ගජිං | | | | | | | |

## පහතරට ඉලංගම් සරඹ

7 වැනි සරඹය : දොංතග දිතගත ගත් දෑහිං

ඉරට්ටිය : දොම්තකු // දොම්තග දිතගත ගත

ගුගුදිත ගත දොම්තත් ගුහිතිග දිරිකිට තා

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම ගුණ | දොම් | - | - | - | ත | - | ග | - | දි | - | ත | - | ග | - | ත | - |
| | ගත් | - | - | - | - | - | - | - | දැහිං | - | - | - | - | - | - | - |
| දෙගුණ | දොම් | - | ත | ග | දි | ත | ග | ත | ගත් | - | - | - | දෑහිං | - | - | - |
| ඉරට්ටිය | දොම් | - | ත | කු | දොම් | - | ත | කු | දොම් | - | ත | ග | දි | ත | ග | ත |
| | ග | ත | ගු | ගු | දි | ත | ග | ත | දොම් | - | තත් | - | ගුහි | තිග | දිරි | කිට |
| | තා | - | | | | | | | | | | | | | | |

8 වැනි සරඹය : ගුං දෑහිං // ගත් තත් දොම් දිතගත

ඉරට්ටිය : දොම් තග දිත ගත ගත් තග දිතගත

ගත් දෑහිම් ගුං දෑහිම් දෑහිම් දිතගත

ගුදිතක දෙගුදකු දොම්

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම ගුණ | ගුං | - | - | - | දෑහිම් | - | - | - | ගුං | - | - | - | දෑහිම් | - | - | - |
| දෙගුණ | ගත් | - | - | - | තත් | - | - | - | දොම් | - | - | - | දි | ත | ග | ත |
| | ගුං | - | දෑහිම් | - | ගුං | - | දෑහිම් | - | ගත් | - | තත් | - | දොම් | - | දිත | ගත |
| ඉරට්ටිය | ගුං | - | දෑහිම් | - | ගුං | - | දෑහිම් | - | ගත් | - | තත් | - | දොම් | - | දිත | ගත |
| | දොම් | - | ත | ග | දි | ත | ග | ත | ගත් | - | ත | ග | දි | ත | ග | ත |
| | තත් | - | දෑහිම් | - | ගුං | - | දෑහිං | - | දෑහිම් | දෑහිං | දිත | ගත | ගුදි | තක | දිකු | දකු |
| | දොම් | - | - | - | | | | | | | | | | | | |

9 වැනි සරඹය : ත රි ක ඩ (ත ර් - රි ක ඩ)
දි රි ක ඩ (දි ර් - රි ක ඩ)

ඉරට්ටිය : තත් තරි ගුඳගත ගදිගත දිත්කුම්
තත් තරි දිත් තරි දොම් තරි කුරුඬින්
තරි දිරි කඩ ගුඳ තා

| | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | ත | ර් | ර් | ර් | රි | - | - | - | ක | - | - | - | ඩ | - | - | - |
| | දි | ර් | ර් | ර් | රි | - | - | - | ක | - | - | - | ඩ | - | - | - |
| දෙගුණ | ත | ර් | රි | - | ක | - | ඩ | - | දි | ර් | රි | - | ක | - | ඩ | - |
| | ත | ර් | රි | - | ක | - | ඩ | - | දි | ර් | රි | - | ක | - | ඩ | - |
| ඉරට්ටිය | තත් | - | ත | රි | ගු | ඳ | ග | ත | ග | දි | ග | ත | දිත් | - | කුම් | - |
| | තත් | - | ත | රි | දිත් | - | තරි | - | දොම් | - | තරි | - | කුරු | - | ඬින් | - |
| | ත | රි | දි | රි | ක | ඩ | ගු | ඳ | තා | | | | | | | |

## දොඹින පද

**7 වෙනි දොඹින පදය -**

| | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තෙ | යි | - | - | ය | ත් | - | - | තා | - | - | - | දොම් | - | - | - |
| දෙගුණ | තෙ | යි | ය | ත් | තා | දොම් | - | - | තෙ | යි | ය | ත් | තා | දොම් | - | - |

**8 වන දෙඹින පදය**

| | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තෙ | යි | - | - | දො | මි | - | - | තෙ | යි | ය | ත් | දො | මි | - | |
| දෙගුණ | තෙ | යි | දො | මි | තෙයි | යත් | දො | මි | තෙ | යි | දො | මි | තෙයි | යත් | දො | මි |

**9 වන දෙඹින පදය**

| | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | ක | ර | ත | ක් | ත | ක් | කි | ට | ක | ර | ත | ක් | ත | ක් | කි | ට |
| | ක | ර | ත | ක් | ත | ත් | කි | ට | ක | ර | ත | ක් | තා | | | |
| දෙගුණ | කර | තත් | ගත් | කිට | කත් | තක | තරි | කිට | කර | තත් | තත් | කිට | කර | තක් | තා | - |

# 2.3 සාම්ප්‍රදායික නර්තන ඇසුරින් අලංකාර පද නිර්මාණය

සාම්ප්‍රදායික ව ඔබ ඉගෙන ගත්

| | |
|---|---|
| උඩරට | - ගොඩ සරඹ |
| පහතරට | - ඉලංගම් සරඹ |
| සබරගමු | - දොඹින පද |

ඒ ඒ සම්ප්‍රදායයන් අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් ලබාගත් කුසලතාව මෙහි දී වඩාත් වැදගත් වේ. සාම්ප්‍රදායික චලන අනුගමනය කරමින් අලංකාර පද නිර්මාණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. අලංකාර පද යොදා ගනිමින් නිර්මාණය කරන ලද නර්තන අංගයක සෞන්දර්යාත්මක වටිනාකම තීව්‍ර කර ගත හැකි ය.

පහළ තලය, මැද තලය, ඉහළ තලය යන තල භාවිතය කෙරෙහි අවධානය යොමු කර මූලික සරඹ නිර්මාණය වී ඇති අතර ඒවා තව දුරටත් අලංකාර වන අයුරින් පද නිර්මාණය කිරීම කෙරෙහි ඔබේ අවධානය යොමු කළ යුතු ය.

**අලංකාර පද නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු**

- උඩ පැනීම, කැරකීම, වාඩිවීම, දෙපසට ගමන් කිරීම වැනි ක්‍රියාකාරකම් උපයෝගී කර ගැනීම
- අලංකාර පද නිර්මාණය සඳහා තෝරාගන්නා චලන හා එහි අංගහාර සම්ප්‍රදායය අනුව යොදා ගැනීම.
- මාත්‍රා 4+4 තාල රූපය කෙරෙහි අවධානය යොමු කිරීම
- නිර්මාණය කර ගත් අලංකාර පද නිරන්තරයෙන් අභ්‍යාස කිරීම
- බෙර වාදනයට අනුව නර්තනයෙහි යෙදීම
- ප්‍රාසංගික බවින් යුක්ත මාත්‍රා නිර්මාණය කිරීම

**අලංකාර පද නිර්මාණය කිරීමේ වැදගත්කම**

- අලංකාර පද නිර්මාණය කිරීම මඟින් ප්‍රායෝගික කුසලතා වර්ධනය කර ගැනීමට හැකි වීම
- ඒකල ව හා සාමූහික ව රසවින්දන ශක්තිය වර්ධනය කර ගැනීමට හැකි වීම.
- නිර්මාණ කුසලතා වර්ධනය වීම
- නිර්මාණය කරන ලද අලංකාර පද වෙනත් අවස්ථා සඳහා භාවිතයට ගත හැකි වීම

**කාර්ය පත්‍රිකාව**

1. අලංකාර පද සඳහා සුදුසු චලන නිර්මාණය කරන්න.
2. මාත්‍රා 4+4 කවියක් තාල රූපයට නිවැරදි අංගහාර භාවිත කරමින් අලංකාර පද 2ක් ඉදිරිපත් කරන්න.
3. නිර්මාණය කර ගත් අලංකාර පද බෙර වාදනයට අනුව ඒකල ව හෝ සාමූහික ව හෝ නර්තනය කරන්න.
4. ඔබ විසින් නිර්මාණය කරන ලද අලංකාර පද යොදා ගත හැකි වෙනත් අවස්ථා දෙකක් නම් කරන්න.

# 2.4 විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි

**හැඳින්වීම**

මැදුම් තනිතිතට අයත් බෙරපද /දවුල්පද /කස්තිරම/ ඉරට්ටිය/ කලාසම 8 වැනි ශ්‍රේණියේ දී ඔබ ප්‍රස්තාර කර ඇත. එම තිත් රූපයට අදාළ උඩරට වන්නමේ සීරුමාරුව හා අඩව්ව ද, සබරගමු වන්නමේ අඩව්ව ද, මාත්‍රා 3 +4 දෙතිතට (මැදුම් මහ) අයත් බෙරපද/ දවුල් පද ඇතුළු ව 9 වැනි ශ්‍රේණියට නියමිත වන්නමේ /සින්දු වන්නමේ (සිංහරාජ/ අනුරාග දණ්ඩ තාලය / විරාඩි) කස්තිරම, සීරුමාරුව/ ඉරට්ටිය/කලාසම දක්වා අදාළ කොටස් ද කඩතුරා කවි, පන් නෙළීමේ කවි, ගොයම් කැපීමේ කවි, සොකරි කවි යන කවි ගායනා ද 9 වැනි ශ්‍රේණියේ දී ප්‍රස්තාර කළ යුතු ව ඇත.

**උඩරට - 8 ශ්‍රේණියට අදාළ වෛරෝඩි වන්නමේ සීරුමාරුව සහ අඩව්ව ප්‍රස්තාර කිරීම**

සීරුමාරුව- තකට දො දොම් තා කඩතක තරිකිට තකට දො දොම් තා

අඩව්ව - ගත්ත තෙහගු තකට තකඳ තක්කඩ ජික්කඩ තරිකිට තකට තකඳ
ගතකු තෙතිගු තකට තකුඳ තා තත්කඩ තරිකිට ජිත් ජිත්කඩ තරිකිට තොං තොංකඩ තරිකිට නං

| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සීරුමාරුව | ත | ක | ට | දො | දොම් | - | තා | - | කඩ | තක | තරි | කිට |
| | ත | ක | ට | දො | දොම් | - | තා | - | | | | |
| අඩව්ව | ගත් | - | ත | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ඳ |
| | තක් | කඩ | ජික් | කඩ | තරි | කිට | ත | ක | ට | ත | කු | ඳ |
| | ග | ත | කු | තෙ | ති | ගු | ත | ක | ට | ත | කු | ඳ |
| | තා | - | තත් | කඩ | තරි | කිට | ජිත් | - | ජිත් | කඩ | තරි | කිට |
| | තොං | - | තොං | කඩ | තරි | කිර | නං | | | | | |

**සබරගමු - 8 ශ්‍රේණියට අදාළ කදම්බ පක්ෂි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කිරීම**

අඩව්ව - ජෙංත තකට දිරිකිට තරිකිට ගත ගත කුදගත ගතත් ජෙජෙං
ගත් කිත් තත් කීතත් ජෙ ජෙං තා කුන් දත් තරිකිට ගතත් කුකඳ
තා

| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අඩව්ව | ජෙං | - | ත | ත | ක | ට | දිරි | කිට | තරි | කිට | ග | ත |
| | ග | ත | කු | ද | ග | ත | ග | තත් | - | ජෙ | ජෙං | - |
| | ගත් | - | කිත් | - | තත් | - | කි | තත් | - | ජෙ | ජෙං | - |
| | තා | - | කුන් | දත් | තරි | කිට | ග | තත් | - | කු | කු | ඳ |
| | තා | - | | | | | | | | | | |

2.4 ඊශ්වර කුණ්ඩ තාලය - පහතරට

| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | දොම් | - | - | දොම් | - | ග | දි | කි | ට | ග | දි | ත |
| | දො | දොම් | - | තා | | | | | | | | |
| තානම | තෙ | නා | - | තෙ | න | තෙ | න | තෙම් | - | තෙ | න | න |
| | තෙ | න | තෙ | නා | | | | | | | | |
| කවිය | කි | පී | - | ලොව | - | දි | ලෙ | න | තෙ | ද | - | ති |
| | ලො | නි | දු | ගේ | - | - | හැ | පී | - | දුක් | - | ඊ |
| | සින් | උන් | - | ස | ත | ගොස් | - | නො | ල | ගේ | - | - |
| | පි | පී | - | ව | ත | ක | මල් | වි | ල | ත | ඹ | ර |
| | නි | ක | ල | ගේ | - | - | නො | පී | - | න | නූ | කවු |
| | ද | වෙ | නු | ස | ර | ණ | රැස් | - | ග | ගේ | - | - |
| ඉරට්ටිය | දොම් | තක | තදි | කිත | තරි | කිට | ගත | ගුගු | දම් | ගුගු | දිත් | තා- |
| | ගත | තහකඩ | දොහොකඩ | දිත් | - | - | තරිතුම් | දිරිතුම් | ගුගු | දම් | - | - |

මාත්‍රා 3 + 4 දෙතිත (මැදුම් මහ දෙතිත ) බෙර පද - දවුල් පද

| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උඩරට | ත | කුං | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොම් | - | ත | ක |
| පහතරට | ගුං | - | ද | ග | ති | ග | ත | ගත් | - | ත | ගු | දි | ගු | ඳ |
| සබරගමු | කු | ඳක් | - | තක් | - | කි | ට | ත | ක | ට | ජී | මි | ත | ක |

**ඉගෙන ගන්නා සම්ප්‍රදායයට අදාළ ව බෙර පදය තෝරා ගත යුතු ය.**

**උඩරට - සිංහරාජ වන්නම (මාත්‍රා 4 + 4 තාලය)**

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | දො | දොං | - | ත | ත | කු | දොං | - | දො | දොං | - | ත | ත | කු | දොම් | - |
| තානම | + | ත | නත් | ත | නෙ | න | තම් | - | - | ද | නත් | ත | නෙ | න | තම් | - |
| | + | ද | නත් | ත | නෙ | න | තම් | - | - | දන | තා | - | නා | - | ත | න |
| | + | ත | නත් | ත | නෙ | න | තම් | - | - | ද | නත් | ත | නෙ | න | තම් | - |
| | + | ද | නත් | ත | නෙ | න | තම් | - | - | දන | තා | - | නා | - | - | - |
| කවිය | + | පෙ | රත් | ක | ලෙ | ක | සි | හ | - | ර | ජෙක් | වැ | ටු | ණි | ම | හ |
| | + | ළි | දක් | තු | ළ | ක | ඉ | බි | - | ල | ඩෙක් | ක | ර | පු | වැ | ඩ |
| | + | හැ | රත් | මෙ | හෙ | ම | ය | ස | - | වැ | ඩක් | උ | ණේ | - | නැ | ත |
| | + | චි | රත් | ක | ලෙ | ක | පැ | ව | - | තු | මක් | ය | සයි | - | හැ | ඩ |
| | + | දු | රත් | බැ | ලු | ම | නො | ව | - | ල | ගත් | බ | ල | න | අ | ය |
| | + | හ | ටත් | ඵ | ලෙ | ස | වෙ | යි | - | කැ | ටත් | ත | බ | මි | ද | ඩ |
| | + | ව | ටත් | අ | ය | ට | දෑ | නෙ | - | න | ටත් | කි | ය | මි | ම | ම |
| | + | ර | ටක් | ව | ටි | න | සි | හ | - | ර | ජ | වන් | න | මෙ | හැ | ඩ |
| කස්තිරම | තක | ටත | කට | තක | තරි | කිට | කුන් | දත් | තක | ටත | කට | තක | තරි | කිට | කුන් | දත් |
| | තක | ටක | කට | තක | තරි | කිට | කුන් | දත් | රුං | තක | ජිං | තක | ජිං | තක | ජිං | කුඳ |
| | රුං | තක | ජිං | තක | ජිං | තක | ජිං | කුඳ | රුං | තක | ජිං | තක | ජිං | තක | ජිං | කුඳ |
| | තා- | ග්ග | ජිං | තක | තරි | කිට | කුන් | දත් | තා- | ග්ග | ජිං | තක | තරි | කිට | කුන් | දත් |
| | රුං | තක | ජිං | තක | තරි | කිට | කුන් | දත් | තා | | | | | | | |

**පහතරට අනුරාග දණ්ඩ තාලය සින්දු වන්නම**

**තාලය මාත්‍රා : 4**

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ත | ක | දිත් | - | ත | ක | දොම් | - | දොම් | - | දිම් | - | ත | ක | දොම් | - |
| | තෙ | න | තෙම් | - | තෙ | න | තෙ | නෙ | නා | - | - | තෙ | තම් | - | තෙ | න |
| | නා | - | - | - | - | - | තෙ | නෙ | තම් | - | තෙ | නෙ | නා | - | - | - |
| | තෙ | න | තෙම් | - | තෙ | න | තෙ | නෙ | නා | - | - | තෙ | තම් | - | තෙ | න |
| | නා | - | - | - | - | - | තෙ | නෙ | තම් | - | තෙ | නෙ | නා | - | - | - |
| | තා | - | ර | ග | නා | - | මැ | දි | නා | - | දි | සි | සු | - | බ්‍රු | ක |
| | රා | - | - | - | - | - | ලෙ | ස | සො | මි | ගු | ණෙ | නා | - | - | - |
| | ඒ | - | රා | - | ව | ණ | රා | - | ව | න | නැ | ගි | ශු | - | ක්‍ර | සු |
| | රා | - | - | - | - | - | සු | ර | ස | ම | ගි | ව | නා | - | - | - |
| | ත | ක | දිත් | - | ත | ක | දොම් | - | කිත් | - | තත් | - | ති | ම් | ත | ක |
| | ත | රි | ග | ත | දි | තු | දං | - | දොම් | - | ත | දොම් | - | ත | ග | ත |
| | ත | ක | තති | - | ගුහි | තිග | දිරි | කිට | තා | - | - | - | | | | |

තාරඟනා මැදිනා දිසි සුබ්‍රු කරා ලෙස සොමි ගුණෙනා
ඒ රාවණා රාවණ නැගි ශුක්‍ර සුරාසුර සමගි වනා
තෝරමිනා කිරනා තිසි අග්‍ර මිණෙවු කිරුළක දරනා
නාරායණ නිතිනා දිසි දීර්ඝ තිලෝ සත රැක දෙමිනා

විරාඩි වන්නම මහ (මාත්‍රා 4 ) තනිතිත

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | ජි | මි | ත | කු | දා | - | දොම් | - | ජි | මි | ත | කු | දා | - | දොම් | - |
| තානම | තා | - | නා | - | ත | න | ත | ම් | ත | න | ත | න | ත | න | ත | ම් |
| | + | + | ත | න | තා | - | - | - | නා | - | - | - | - | - | - | - |
| | තී | - | නා | - | ති | න | ති | ම් | ති | න | ති | න | ති | න | ති | ම් |
| | + | + | ති | න | තී | - | - | - | නා | - | - | - | - | - | - | - |
| කවිය | පා | - | නා | - | ය | ස | සි | න් | සි | රි | පි | රි | කු | ලු | ණෙ | න් |
| | + | + | හි | ඳ | වා | - | රා | - | ඩි | - | - | - | - | - | - | - |
| | බූ | - | නා | - | ර | ජ | සි | ත් | එ | ක | ලෙ | ස | නි | ර | තු | රු |
| | + | + | වී | - | වා | - | - | - | ඩි | - | - | - | - | - | - | - |
| | ගා | - | නා | - | හි | මි | සි | ත් | පි | න | ව | න | ය | ස | සි | න් |
| | + | + | න | ක | වා | - | රා | - | ඩි | - | - | - | - | - | - | - |
| | සේ | - | නා | - | මැ | ද | සි | ත් | කී | - | මේ | - | ව | න් | න | ම |
| | + | + | ද | නු | වී | - | රා | - | ඩි | - | - | - | - | - | - | - |
| කලාසම | කු | දි | ත | ග | ති | ත | කු | ද | ග | ති | ග | ත | කු | ද | ග | ත |
| | කු | දි | ත | ග | ති | ත | කු | ද | ග | ති | ග | ත | කු | ද | ග | ත |
| | කු | දි | ත | ග | ති | ග | කු | ද | ග | ති | ත | කු | දිත් | - | තත් | - |

කඩතුරා කවි මැදුම් (මාත්‍රා 3) තනිතිත

| 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සි | හින් | සි | නි | ඳු | ස | එ | ව | පැ | ල | ඳ |
| + | විත් | උ | න් | ම | ර | ඟ | න | - | - | - | - |
| + | ව | හන් | ස | නු | ඹ | අ | ප | අ | ත | හැ | ර |
| + | මන් | ද | ම | හ | ඬ | වු | ඬ | - | - | - | - |
| + | අ | හං | කා | - | ර | ඒ | - | ම | ර | ඟ | න |
| + | දුක් | කා | - | බු | දු | ගු | ඬ | - | - | - | - |
| + | මිහි | න් | ත | ලා | - | ධා | - | තු | බ | ලෙ | න් |
| + | කඩ | ති | ර | හ | රි | මි | න | - | - | - | - |

මැදුම් ( මාත්‍රා 3 ) තනිතිත

| 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සිද් | ධ | මු | නි | ඳු | වැ | ඩ | සි | ට | බෝ | - |
| මු | ල | වි | දු | රා | - | ස | න | - | - | - | - |
| + | යුද් | ධ | ක | රන් | - | න | ට | ද | ස | බිම් | - |
| බ | ර | විත් | - | පැ | ර | දු | ණ | - | - | - | - |
| + | වැද් | ද | නො | දී | - | හැ | ම | පි | රි | ප | ත |
| දු | ර | ලා | - | හ | රි | මි | න | - | - | - | - |
| + | බුද් | ධ | රත් | - | නෙ | අ | නු | හ | ස | යෙන් | - |
| ක | ඩ | ති | ර | හ | රි | මි | න | - | - | - | - |

පන් නෙලීමේ කවි - මැදුම් ( මාත්‍රා 3 ) තනිතිත

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කො | නි | න් | කො | න | ට | පන් | - | - | - | - | - |
| උ | දු | රා | - | ගන් | | නේ | - | - | - | - | - |
| තැ | නි | න් | තැ | න | ට | පන් | - | - | - | - | - |
| අ | හු | රු | ද | මන් | - | නේ | - | - | - | - | - |
| අ | නු | න් | ගෙ | පන් | - | කො | ළ | - | - | - | - |
| එක් | - | නො | ක | රන් | - | නේ | - | - | - | - | - |
| බැ | ණු | න් | අ | හන් | - | න | ට | - | - | - | - |
| වෙ | යි | දූ | න | ගන් | - | නේ | - | - | - | - | - |

_මැදුම් ( මාත්‍රා 3 ) තනි තිත

| 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගා | - | න | තෙල් | - | ස | ඳුන් | - | ව | ර | ල | ස |
| ඹ | ම | රි | කො | ට | - | - | - | - | - | - | - |
| මූ | - | ණු | පු | රා | - | තෙල් | - | ගා | - | ගෙ | න |
| ය | න | ක | ල | ට | - | - | - | - | - | - | - |
| මා | - | න | බ | ල | ති | මි | ණි | ව | න් | - | පන් |
| ති | බෙ | න | කො | ට | - | - | - | - | - | - | - |
| නෑ | - | නෙ | නු | ඹ | ත් | එ | න | ව | ද | පන් | - |
| නෙ | ලන් | - | න | ට | - | - | - | - | - | - | - |

ගොයම් කැපීමේ කවි  මහ (මාත්‍රා 4) තනිතිත

| 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | රන් | - | දෑ | - | - | - | කැ | - | ති | - | ගෙ | - | න | - |
| - | - | නි | ති | සැ | - | ර | - | සෙ | - | න | - | වා | - | - | - |
| + | + | රත් | - | ර | - | - | න් | ප | - | ටි | - | ඉ | - | න | - |
| - | - | ව | ට | දි | - | ලි | - | සෙ | - | න | - | වා | - | - | - |
| + | + | රි | වි | දු | - | ටු | - | පි | - | නි | - | බි | - | ඳු | - |
| - | - | ලෙ | ස | ප | - | හ | - | වෙ | - | න | - | වා | - | - | - |
| + | + | දුම් | - | බ | - | ර | - | කෙ | - | තෙ | - | අ | - | පි | - |
| - | - | ගො | ය | මි | - | ක | - | ප | - | න | - | වා | - | - | - |

මැදුම් තනිතිත (මාත්‍රා 3 තාලය)

| 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ඉරු | දෙ | වි | ය | න් | ගේ | - | - | - | - | - |
| - | ඉරු | ග | ල | ගා | - | වා | - | - | - | - | - |
| + | සඳු | දෙ | වි | ය | න් | ගේ | - | - | - | - | - |
| - | සඳු | ග | ල | ගා | - | වා | - | - | - | - | - |
| + | ගුණ | දෙ | වි | ය | න් | ගේ | - | - | - | - | - |
| - | කෝ | වි | ල | ගා | - | වා | - | - | - | - | - |
| + | අ | පිත් | කි | ය | මු | ක | වි | - | - | - | - |
| - | ගොවි | පො | ළ | ගා | - | වා | - | - | - | - | - |

සොකරි කවි (මාත්‍රා 3 තාලය -දොං ජිජිගත)

| 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සො | ක | රි | - | එන් | - | නී | - | ස | බ | යෙන් | - |
| අ | ව | ස | ර | ගන් | - | නී | - | - | - | - | - |
| නැ | ටුම් | - | න | ටන් | - | නී | - | තා | - | ලෙ | ට |
| රා | - | ග | ති | යන් | - | නී | - | - | - | - | - |
| ප | ද | අ | ල් | ලන් | - | නී | - | පි | ය | යු | රු |
| ළැ | ම | සො | ල | වන් | - | නී | - | - | - | - | - |
| කැ | ඩ | ප | ත | ගන් | - | නී | - | සු | ර | තින් | - |
| මු | හු | ණ | බ | ලන් | - | නී | - | - | - | - | - |

මැදුම් (මාත්‍රා 3) තනි තිත

| 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙ | දා | - | න | ට | න් | නේ | - | ප | ළ | මු | ව |
| ස | බ | ය | ට | එ | න් | නේ | - | - | - | - | - |
| යො | දා | - | කි | ය | න් | නේ | - | තා | - | ලෙ | ට |
| ග | ත | වෙ | වු | ල | න් | නේ | - | - | - | - | - |
| කු | දා | - | වැ | නෙ | න් | නේ | - | ස | බ | යේ | - |
| කොක් | - | හ | ඩ | ල | න් | නේ | - | - | - | - | - |
| වි | දා | - | පා | - | න් | නේ | - | අත් | - | දෙ | ක |
| තෑ | - | ගි | කි | ය | න් | නේ | - | - | - | - | - |

# 2.5 සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය

**උඩරට නර්තන සම්ප්‍රදායය**

**8 ශ්‍රේණියේ දී උගත් වෛරොඩි වන්නම**

උඩරට වන්නම් 18ට අයත් වන්නම් අතුරින් වෛරොඩි වන්නම කස්තිරම දක්වා 8 ශ්‍රේණියේ දී නර්තනය කර ඇත. එයට අදාළ සීරුමාරුව හා අඩව්ව සමඟ වන්නම සම්පූර්ණයෙන් ම 9 ශ්‍රේණියේ දී නර්තනය කළ යුතු ය. මෙහිදී නියමිත තාලරූපයට නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව වන්නමේ සියලු පද කොටස් හා එයට අදාළ කස්තිරම සීරුමාරුව, අඩව්ව නර්තනය කරන්න. සතත අභ්‍යාසයෙන් නර්තන කුසලතාව වර්ධනය කරගත හැකි ය.

කස්තරම - රූඳ ගත ගත ගත කුකුදත්
ගජිංත ගත් ජිත් කුංදත්
තකුඳ ගජිං තකුඳ ගජිං
තකුඳ ගතට ගත කුඳ කුඳ
ගජිංත ගත් ජිත් කුංදත්
ජිකුතක තරිකිට කුංදත් තා

සීරු මාරුව - තකට දොදොං තා කුංදත් තරිකිට
තකට දොදොං තා

අඩව්ව - ගත්ත තෙහිඟු තකට තකුඳ
තත්කඩ ජික්කඩ කඩතක තකට තකුඳ
ගතකු තෙහිඟු තකට තකුඳ
තත් - තත්කඩ තරිකිට ජිත් - ජික්කඩ තරිකිට
තොං - තොංකඩ තරිකිට නං

**සිංහරාජ වන්නම**

මෙම වන්නම නර්තනය කිරීමට ප්‍රථම එයට අදාළ තාල රූපයත්, බෙර පදයත් මූලික ව හඳුනා ගත යුතු ය. එයට අනුකූල ව නිවැරදි නාද මාලාව අනුගමනය කරමින් වන්නමේ කවි ගායනා කිරීම වඩාත් යෝග්‍ය වේ.

සිංහරාජ වන්නම නර්තනය කිරීමේ දී තාල ලක්ෂණය මතු වන පරිදි ඊට සුදුසු පද භාවිත කළ යුතු ය. ඒ සඳහා ඉගෙන ගන්නා ලද සුදුසු අලංකාර පද යොදා ගත හැකි ය.

සිංහරාජ වන්නම :- මාත්‍රා 4 මහ තනිතිත
බෙර පදය :- දොදොංත තකු දොම්

තානම :- තනත් තනෙන තම් දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තා - නා- තන
තනත් තනෙන තම් දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තා - නා-

කවිය :- පෙරත් කලෙක සිහ රජෙක් වැටුණු මහ
ළිඳක් තුළෙක ඉබි ලඩෙක් කරපු වැඩ
හැරත් මෙහෙම යස වැඩක් උණේ නැත
චිරත් කලෙක පැවතුමක් යසයි හැඩ

දුරත් බැලුම නොව ළඟත් බලන අය
හටත් එලෙස වෙයි කැටත් තබමි දඩ
වටත් අයට දූනෙනටත් කියමි මම
රටක් වටින සිහ රජ වන්නමෙ හැඩ

කස්තිරම :- තකට තකට තක තරිකිට කුංදත් ///
රුංතක ජිංතක ජිංතක ජිංකුඳ ///
තාග්ග ජිංතක තරිකිට කුංදත් //
රුංතක ජිංතක තරිකිට කුංදත් තා

ඊශ්වර කුණ්ඩ තාලය
(පහතරට සින්දු වන්නම) මාත්‍රා 3 තිත

පහතරට නර්තන සම්ප්‍රදායයට අයත් සින්දු වන්නම් අතර ''ඊශ්වර කුණ්ඩ තාලයේ සින්දු වන්නම'' 8 ශ්‍රේණියේ දී ඔබ ඉගෙන ගෙන ඇත. මාත්‍රා 3 තාල රූපයට අනුව එනම් මැදුම් තනි තිතට මෙම වන්නම නැවත ගායනය කර මතකය අවදි කර ගනිමින් ඉරට්ටිය සමඟ නර්තනය කිරීමට පුහුණු විය යුතු ය. ඔබ 8 ශ්‍රේණියේ දී ඉගෙන ගත් පහතරට ඊශ්වර කුණ්ඩ තාලයේ වන්නමට නිශ්චිත පද කොටස් අංගහාර සහිත ව ප්‍රදර්ශනය කරමින් නැටිය යුතු ය. එයට අදාළ ඉරට්ටිය නැටීම පිළිබඳ කුසලතාව මෙහි දී ලබාගත යුතු ය. ඒ අනුව 8 ශ්‍රේණියේ දී ඉගෙන ගත් මෙම වන්නම 9 ශ්‍රේණියේ දී සම්පූර්ණයෙන් නර්තනය කිරීමේ කුසලතාව ලබා ගත යුතු ය.

ඊශ්වර කුණ්ඩ තාලය - (පහතරට)
මාත්‍රා තුනේ තනි තිත - (මැදුම් තනිතිත)

බෙරපදය :- දොදොම් දොම් ගදිකිට ගදිත
දොදොම් තා

තානම :- තෙනා තෙන තෙන තෙම් තෙනෙන
තෙන තෙනා

කවිය :- කිපී ලොව දිලෙන තෙද තිලොනිඳුගේ
හැපී දුක් රැසින් උත්සත ගොස් නොලගේ
පිපී වන කමල් විල තඹර නිකලගේ
නොපීනනු කවුද වෙනු සරණ රැස් ගගේ

ඉරට්ටිය :- දොම්තක තදිකින තරිකිට ගත
ගුගුදම් ගුගුදිත් තා ගත තහකඩ
දොහොකඩ දිත් තරිකුම් දිරිකුම්
ගුගුදා

**අනුරාග දණ්ඩ තාලය**
**(පහතරට සින්දු වන්නම)**

පහතරට සම්ප්‍රදායයේ සින්දු වන්නම් අතරට ගැනෙන අනුරාග දණ්ඩ තාලයේ සින්දු වන්නම 9 ශ්‍රේණියේ දී ඉගෙනීමට ඇත. මාත්‍රා 4 තනි තිතේ තාලයට, එනම් මහ තනිතිතට මෙම වන්නම නර්තනය කළ යුතු වේ. මෙකී වන්නමේ තාලරූපය ඉස්මතු වන පරිදි පද කොටස් හා ඉරට්ටිය නැටීම විශේෂ වෙයි.

## පහතරට අනුරාග දණ්ඩ තාලය

තාලය :- මාත්‍රා 4 තනිතිත

බෙරපදය - තක දිත් තක දොං දොං දිං තක දොං

තානම :- තෙන තෙම් තෙන තෙනෙනා - තෙනම් තෙන නා තෙනනම් තෙනෙ නා
තෙන තෙම් තෙන තෙනෙනා - තෙනම් තෙන නා තෙනනම් තෙනෙ නා

කවිය :- තාරඟනා මැදිනා දිසි සුබුකරා ලෙස සොමි ගුණෙනා
ඒ රාවණ රාවණ නැගි ශුක්‍ර සුරාසුර සමගි වනා
තෝරමිනා කිරණා නිසි අග්‍ර මිණෙවු කිරුළක දරනා
නාරායණා නිතිනා දිසි දීර්ඝ ති ලෝ සත රැක දෙමිනා

ඉරට්ටිය :- තක දිත් තක දොං කිත් තත් කිටිතක
තරිගත දිකුදං දොමිත දොමිත ගත
තකුතත් ගුහිති ගදිරිකිට තා

කදම්බ පක්ෂි වන්නම

සබරගමු වන්නම්වලට අයත් වන්නම් අතුරින් කදම්භ පක්ෂි වන්නම අනුපිළිවෙළෙහි කලාසම තෙක් 8 ශ්‍රේණියේ දී නර්තනය කර ඇත. නැවත කලාසම අඩව්ව සමඟ සම්පූර්ණයෙන් ම 9 ශ්‍රේණියේ දී නර්තනය කළ යුතු වේ. නිවැරදි නාද මාලාව සහිත ව වන්නම ගායනය කළ යුතු අතර අදාළ ව උචිත පද සමඟ නියමිත කලාසම හා අඩව්ව නර්තන කළ යුතු ය.

කලාසම :- ජිංත තුකුද තා තකට///
ජිංත තුකුද ගතිත කුකුද
ජිංත කුකුද තා ගතත්

අඩව්ව :- ජෙංත තකට දිරිකිට තරිකිට ගත
ගතකුද ගත ගතත් ජෙජෙං
තත් තිත්තක් කිතත් ජෙජෙං තා
කුංදත් තරිකිට ගතත් කුකුද තා

**විරාඩි වන්නම**

සබරගමු නර්තන සම්ප්‍රදායයට අයත් වන්නම් අතරින් 6,7,8 ශ්‍රේණිවල දී පිළිවෙළින් අනිලා වන්නම, කුදිරඩි වන්නම , කදම්බ පක්ෂි වන්නම ප්‍රායෝගික ව අධ්‍යයනය කර ඇත. 9 ශ්‍රේණියේ දී ඉගෙනීමට නියමිත විරාඩි වන්නම මාත්‍රා 4 තනිතිතේ තාලයට (මහ තනි තිතට) නර්තනය කළ යුතු වේ. මෙකී වන්නමේ තාල රූපයට අනුව එයට ආවේණික සහ උචිත පද නැටීම කළ යුතු ය. ''ජිමිත කුදා දොම්'' යන මාත්‍රා 4 තනි තිතට වාදනය කළ හැකි දවුල් පදයට අනුව සෑම තාල ලක්ෂණයක් ම මතුවන පරිදි කෙරෙන ගායනයට අනුව උචිත පද නැටීම කළ යුතු ය. එය බොහෝ සබරගමු වන්නම්වල දක්නට ලැබෙන ආවේණික ලක්ෂණයකි. එම ආවේණික ලක්ෂණය ප්‍රදර්ශනය වන ආකාරයට නියමිත අංගහාර පවත්වා ගනිමින් නර්තනය කළ යුතු වේ.

## විරාඩි වන්නම

මාත්‍රා 4 තාලය (මහ තනි තිත)
දවුල් පදය - ජිමිත කුදා දොම්

තානම :- තානා තනතම් තන තන තනතම්
තන තානා...
තීනා තිනතිම් තින තින තිනතිම්
තීන තීනා...

කවිය :- පානා යසසින් සිරිපිරි කුලුණෙන්
හිඳ වාරාඩි
බූනා රජ සිත් එක ලෙස නිරතුරු
වී වාඩි
ගානා හිමි සිත් පිනවන යසසින්
නෙක වාරාඩි...
සේනා මැදසිත් කී මේ වන්නම
දනු වීරාඩි

කලාසම :- කුදිත ගතිත කුද ගතිගත කුදගත
කුදිත ගතිත කුද ගතිගත කුදගත
කුදිත ගතිත කුද ගතිත කුදිත්තත්.

අඩව්ව :- ගත්තකු ජිත්තා- දොංගඩ තරිකිට ජිත්තා
ගතකුද ගතකුද
තක්කඩ ජිත්කඩ දොංගඩ තරිකිට
දොංත ගතිත ගත ගතිගත දිරිකිට තරිකිට තා
ජිමිත් තත් ගතිගත හර්ජිත් ගතකුංතා.

# 3 පරිච්ඡේදය

## 3.1 සාම්ප්‍රදායික වාi භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි

### ගැට බෙරය

උඩරට නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැට බෙරය වේ. මැදින් ගැටයක් සේ පෙනෙන බැවින් මෙසේ හැඳින්වේ. බෙරයෙහි දෙපස වම් ඇස හා දකුණු ඇස වශයෙන් හඳුන්වා තිබීම මෙහි ඇති සුවිශේෂ ලක්ෂණයකි.

කොහොඹ, ඇහැළ, කොස්, ගංසූරිය වැනි අරටු සහිත දැව බෙර කඳ සකස් කිරීම සඳහා යොදාගන්නා අතර, බෙරයේ වම් පස සඳහා හරක් හම නැතහොත් මුව හම ද, දකුණු පස සඳහා වඳුරු හම, එළුහම නැතහොත් තලගොයි හම ද යොදා ගැනීම සම්මත ක්‍රමය යි.

සාම්ප්‍රදායික මිනුම් ක්‍රම අනුව බෙරයෙහි දිග සඳහන් වන්නේ තුන් වියත් තුනඟුලකි. (අඟල් 27ක් පමණ) බෙරයේ මුහුනතෙහි විෂ්කම්භය විග්ගුස්සකි. (අඟල් 7-8ක් පමණ) එනම් වාදකයාගේ අත මිට මොළවා. මහපටැඟිල්ල හා දබරැඟිල්ල දිගු කිරීමෙන් ලැබෙන දිග විග්ගුස්ස නමින් හැඳින්වේ.

ගැට බෙරයෙන් වාදනය වන බීජාක්ෂර සතර තත්, ජිත්, තොං, නං වේ. තත්, තොං යන අක්ෂර වම් පසින් ද, ජිත්, නං යන අක්ෂර දකුණු පසින් ද, වාදනය කිරීම සාම්ප්‍රදායික ක්‍රමය යි. බෙර වාදනයේ දී ධ්වනි ගුණය ආරක්ෂා කර ගැනීම සඳහා වාදන විධි ක්‍රම වැදගත් වේ. අක්ෂර භාවිතයේ දී ඒ ඒ ධ්වනි ගුණය ආරක්ෂා කරගැනීමට වාදකයා විසින් තම අත්ල නිවැරදි ක්‍රමවේදයන්ට අනුව භාවිත කළ යුතු ය. එහි දී එක් එක් අක්ෂර උපදවා ගැනීමට බෙර ඇස තුළ හස්ත ස්ථානගත කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. ඒ මඟින් ධ්වනි ගුණයේ විවිධතා මතු කර ගැනීමට හැකි වනු ඇත.

බෙරයෙහි කොටස්

1. බෙර කඳ
2. බෙර පුහුල
3. කැපුම් හම
4. වම් ඇස
5. දකුණු ඇස
6. වෙනිවර කැරැල්ල
7. වරපට
8. කන්වරය
9. කයිපුඩි වළල්ල
10. බෙර ලනුව
11. සුරත් තට්ටුව



වාදන අවස්ථා - ආගමික හා සමාජීය අවස්ථා

* ආගමික උත්සව - පිරිත් පින්කම්, පෙරහැර, තේවාවාදන අවස්ථා

* සමාජීය අවස්ථා ශාන්තිකර්ම, උත්සව, සමාරම්භක අවස්ථා, සන්දර්ශන, තූර්යවාදන

පැවරුම

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ගැට බෙරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. ගැට බෙරය සකස් කිරීමට යොදාගන්නා ද්‍රව්‍ය ලැයිස්තුවක් සකස් කරන්න.
3. ගැට බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.
4. ගැට බෙරය වාදනය කරන අවස්ථා නම් කරන්න.

### 3.2 විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය

කවර සම්ප්‍රදායයක වුව ද බෙරපද දවුල්පද නිර්මාණය වී තිබෙන්නේ සතර බීජාක්ෂර මුල් කොට ගෙන ය. එබැවින් සම්ප්‍රදාය ත්‍රිත්වයට ම අදාළ බෙරපද/ දවුල්පද කීපයක් වාදනය කරන ආකාරය විමසා බලමු.

**උඩරට බෙර වාදනයේ දී පද වාදනය වන අයුරු**

තත්කඩ - ''**තත්**'' යන අක්ෂරය වම් බෙර ඇසෙන් වාදනය කළ පසු ''**කඩ**'' යන පද කොටස දකුණු බෙර ඇසෙන් වාදනය කළ යුතු ය. ''**ක**'' යන්න සුළැඟිල්ලේ සිට මැදැඟිල්ල දක්වා බෙර මුහුණතෙහි වදින සේ ද ඩ යන්න දබරැඟිල්ල වදින සේ ද වාදනය කළ යුතු ය.

ජිත්කඩ - දකුණු බෙර ඇසෙන් ජිත් වාදනය කිරීමේ දී දකුණතේ සුළැඟිල්ලේ සිට මැදැඟිල්ල දක්වා කොටස භාවිත කරමින් දකුණු බෙර ඇසේ මැදට ගසා '**ජිත්**' අක්ෂරය උපදවා ගත යුතු ය. මෙහි දී ධ්වනිගුණයේ ගුණාත්මක බව ආරක්ෂා කරගැනීම උදෙසා වම් අත්ලේ ඇඟිලි සහිත කොටසින් වම් බෙර ඇස මඳ වශයෙන් තද කිරීමක් සිදු කෙරේ. පෙර පරිදි 'කඩ' යන පද කොටස වාදනය කළ හැකි ය.

තොංකඩ - ''**තොං**'' යන පද කොටස බෙරයේ වමෙන් වාදනය කළ යුතු අතර ඒ සඳහා අතේ මහපටැඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට කැපුම් හම ආසන්නයට වාදනය කළ යුතු ය. ''**කඩ**'' යන පද කොටස පෙර ආකාරයට ම වාදනය වේ.

නංකඩ - ''**නං**'' යන අක්ෂරය වාදනය කිරීමේ දී සුළැඟිල්ලේ සිට මැදැඟිල්ල තෙක් ඇඟිලි තුන එක්කොට අත්ල මඳක් ඉහළට එසවෙන ආකාරයට බෙරයේ මැද කොටසත් කැපුම් හමත් අතරට ගසා අක්ෂරය උපදවා ගත යුතු ය. 'කඩ' යන පද කොටස පෙර ආකාරයට ම වාදනය වේ.

පදය - ජිං ගත ගො ගො

ජිං - සුළැඟිල්ලේ සිට මැදඟිල්ල තෙක් ඇඟිලි තුන එක්කොට බෙරයේ දකුණු ඇසේ ඉහළට හඬ විහිදී යන ආකාරයට වාදනය

ග - මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට බෙරයේ වම් ඇස මැදට වාදනය

ත - මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට බෙරයේ දකුනු ඇස මැදට වාදනය

ගො - අතේ මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට කැපුම් හම ආසන්නයට (බෙරයේ වම් ඇසට) වාදනය කළ යුතු ය.

## පහතරට බෙර වාදනයේ දී පද වාදනය වන අයුරු

ගුංදං - ''ගුං'' යන අක්ෂරය හයි තට්ටුවෙන් ද දං යන අක්ෂරය සුරල් තට්ටුවෙන් ද වාදනය කළ යුතු වේ.

ගත්තම් - ''ගුං'' යන අක්ෂරය වාදනය කළ හයි තට්ටුවෙන් හඬ පුපුරා යන පරිදි ''**ගත්** '' යන අක්ෂරය වාදනය කළ යුතු ය. ''**දං**'' යන අක්ෂරය වාදනය කළ ආකාරයට ම ''**තම්**'' යන අක්ෂරය ද වාදනය කළ යුතු ය.

දෙගතම් - ''**දෙ**'' යන අක්ෂරය සුරල් තට්ටුවෙන් ද ''**ත**'' යන අක්ෂරය හයි තට්ටුවෙන් ද වාදනය කොට ''**තම්**'' යන අක්ෂරය පෙර පරිදි වාදනය කළ යුතු ය.

ගතිගත - ''**ග**'' යන අක්ෂරය හයි තට්ටුවෙන් ද ''**ති** ''හා''**ත**'' යන අක්ෂර සුරල් තට්ටුවෙන් ද වාදනය කළ යුතු ය.

මූලික පද කොටස් හඳුනාගත් ඔබට දැන් බෙර පදයක් වාදනය කළ හැකි ය. ''**ගුං ද දෙගත ගතිගත ගුද** ''යන බෙර පදය වාදනය කළ යුතු ආකාරය විමසා බලමු. **ගුං, ග, ගු, ගො** අක්ෂර හයි තට්ටුවෙන් ද **ද, දෙ, ත, ති, න, ඳ** යන අක්ෂර සුරල් තට්ටුවෙන් ද වාදනය කළ යුතු ය. මෙසේ ''ගුංද දෙගත ගතිගත ගුද' බෙර පදය වාදනය කළයුතුය.

## 3.2 දවුල් වාදනයේ දී පද වාදනය වන අයුරු

දවුල් වාදනයේදී නර්තනයට අවශ්‍ය පද වාදන ක්‍රම පිළිබඳ මූලික දැනුම ලබා ගැනීම ඉතා වැදගත් වේ. විශේෂ වාදන අවස්ථාවල දී මෙන්ම කවි ගායනය සමග නර්තනය කරන අවස්ථාවල දී දවුල වාදනය කරන ආකාරය එකනෙකට වෙනස්වෙයි. මෙහි ක්‍රම දෙකකි.

එනම්- - කඩිප්පුව භාවිත කිරීමෙන් දවුල වාදනය කිරීම
- දෑතින් ම දවුල වාදනය කිරීම

කවි ගායනයත් සමග නර්තනය කිරීමේ දී දවුල වාදනය (දෑතින්) කළ යුතු ආකාරය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

උඩරට සහ පහතරට බෙර වාදනයේ දී මෙන්ම දවුල් වාදනයේ දී ද වම හා දකුණ වශයෙන් දෙපැත්තක් පවතී. එය තියුණු හා හඬ විහිදෙන පැත්ත හා ගැඹුරු හඬ විහිදෙන පැත්ත වශයෙන් දැක්විය හැකිය. තියුණු හඬ විහිදෙන පැත්ත කඩිප්පුව උපයෝගී කරගෙන වාදනය කිරීම ද, ගැඹුරු හඬ පවතින පැත්ත අතින් වාදනය කිරීමද කළ යුතුය.

දවුල වාදනය කිරීමට අවශ්‍ය මූලික අක්ෂර වාදනය හුරු වීමේ දී ආධුනිකයකු පළමු ව හුරු කරන්නේ දවුල් තට්ටුවට (දවුල් ඇසට) අත භාවිත කරන අයුරු ය. මූලික සරඹ හුරුකර ගැනීමේ දී මේ පිළිබඳ දැනුම ලබාගත යුතුය. **ජිං** හා **තොං** වාදනයේ දී දවුලේ ඇස්දෙකම භාවිතයෙන් සමබර ව සමාන හඬ මතු වන සේ වාදනය කළ යුතුය. නිවැරදි හඬ මතුවන සේ අක්ෂර වාදනය හුරුවීමෙන් පසුව පද වාදනය කළ යුතුය. නිදසුන් ලෙස **ජිං කිටිතත් තත් කිටිතක** යන මැදුම් තනිතිතට අයත් දවුල් පදය වාදනය කිරීමේ දී ඉහත අභ්‍යාසය හුරුකර , **කිටිතත්** හා කිටිතක යන පදය වාදනය කිරීමට හුරු විය යුතුය.

**කිටි** යන පද වාදනයේ දී දකුණු අත දවුල් ඇසට තබමින් අත පෙරළමින් වාදනය කළ යුතුය.

**තත්** යන පද වාදනයේ දී දවුල් ඇසට අත තද වන අයුරින් තබා වාදනය කළ යුතුය.

දෑත දවුලට හුරුවූ පසු කඩිප්පුව භාවිත කිරීමෙන් දවුල් පද වාදනය කිරීම හුරු විය යුතුය. වෙදගිල්ල හා මැදැගිල්ල ආධාරයෙන් තෙරපීම හා ලිහිල් කිරීම හුරු වන ලෙස සරඹ පද වාදනය කළ යුතුය. ඉතා සැහැල්ලු ලෙස කඩිප්පුව ඇඟිලි අතර රඳවමින් අභ්‍යාස කළ යුතු ය.
පද වාදනයේදී කඩිප්පුව මුලින්, මැදින්, අගින් වශයෙන් තුන් ආකාරයකට හසුරුවමින් වාදනය කිරීම සුවිශේෂ ලක්ෂණයකි. පෙරළුම් සුරල් වාදනයේදී කඩිප්පුව නිවැරදිව හැසිරවීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය. කඩිප්පුව මුලින් අල්ලා දවුල් තට්ටුවට (දවුල් ඇසට) වාදනය කිරීමෙන් **දිත් , ජික් ,කි** අක්ෂර වාදනය කෙරේ. කඩිප්පුවේ මැදින් කඩ යන අක්ෂරය වාදනය කළ යුතුය.
**තක්කඩ, ජික්කඩ, තොංකඩ, නංකඩ** වශයෙන් සතර බීජාක්ෂර පැහැදිළිවන අයුරින් කඩිප්පුව භාවිත කරමින් වාදනය කළ යුතුය.

උඩරට බෙර සරඹ

1. තකට...
2. තකට කුදට...
3. තකට තකට කුද.

පහතරට බෙර සරඹ

1. ගුහිති
2. ගුහිති ගහිති
3.ගුහිති ගදිරිකිට

දවුල් සරඹ

1. කිත්තා කිත්තා ජෙජ් ජෙං තා-කිත්තක දොමිකිට ජෙජ් ජෙං තා
2. කිත්තා කිත්තා ජෙජ් ජෙං තා-කිටිතක දොමිකිට ජෙජ් ජෙං තා
3. කිත්තක දොමිකිට -කිටිතක දොමිකිට

| | /1 | 2 | 3 | /1 | 2 | 3 | /1 | 2 | 3 | /1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උඩරට<br>අලංකාර පද | ජිං<br>ජිං | -<br>කඩ | ග<br>තක | ත<br>ජිං | ගො<br>රැකු | ගො<br>තක | ජිං<br>ජිං | -<br>තඩ | ග<br>තක | ත<br>ජිං | ගො<br>රැකු | ගො<br>තක |
| පහතරට<br>අලංකාර පද | ගුන්<br>ගුං | -<br>ගුඳ | ද<br>ගත | දෙ<br>ගද් | ග<br>දිත | ත<br>ගත | ග<br>ගද් | දි<br>දිත | ග<br>ගත | ත<br>ගදි | ගු<br>ගත | ද<br>ගුඳ |
| සබරගමු<br>අලංකාර පද | ජිං<br>ජිං | කිටි<br>කුඳ | තත්<br>කුඳ | තත්<br>තත් | කිටි<br>දිරිකිට | තක<br>තරිකිට | ජිං<br>තත් | කිටි<br>කිටි | තත්<br>තක | තත් කිටි තක<br>තත් තරිකිටකිටිතක | | |

### 3.3 පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණය

අශෝක අධිරාජයා විසින් ලක්දිවට ත්‍යාග වශයෙන් දක්ෂිණ බෝධි ශාඛාව එවන ලද අතර රජුගේ නියමය පරිදි බෝධි ශාඛාවට පැවැත්විය යුතු පූජා අතුරින් ඉතා උත්කෘෂ්ට ශබ්ද පූජාත්මක වූ පංචාංගික තූර්ය නාදය ද එලෙස ම පැවැත්විය යුතු යැයි කියා එවූ බව මහාවංශයේ සඳහන් වේ. එතැන් පටන් ලක්දිව පසඟතුරු ගොස පැවත එන්නේ යැයි සිතිය හැකි ය.

''නත්ත෴ පංචාංගික චරිවං කාස
ආතතං විතතං ආතත විතතා නාම
ශුෂිරය ඝනින්ති පංච විධෝ''

යනුවෙන් මහාවංශ ටීකාවේ සඳහන් වේ. වාද්‍ය භාණ්ඩ යනු විවිධාකාරයට වාදනය වන භාණ්ඩ එකතුවකි. මෙම වාද්‍ය භාණ්ඩ වාදනය කරන ආකාරය අනුව කොටස් 5කට බෙදා දැක්විය හැකි ය. ආතත, විතත, විතතාතත, ඝන, ශුෂිර යනුවෙන් එය නම් කළ හැකි ය.

ආතත - අතින් පමණක් වාදනය කරන වාද්‍ය භාණ්ඩ ආතත ගණයට අයත් වේ.
උදා:- ගැටබෙරය, පහතරට බෙරය, උඩැක්කිය, රබාන

විතත - කඩිප්පුවක ආධාරයෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩ විතත ගණයට අයත් වේ.
උදා:- තම්මැට්ටම

විතතාතත - අතින් සහ කඩිප්පුවෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩ මෙම ගණයට අයත් වේ.
උදා:- දවුල

ඝන - මේ සඳහා ලෝහමය ද්‍රව්‍යවලින් නිර්මාණය කරන ලද වාද්‍ය භාණ්ඩ ඇතුළත් වේ.
උදා:- පන්තේරුව, තාලම්පට, තලිය

සුෂිර - සුළඟේ ආධාරයෙන් වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩ ශුෂිර ගණයට අයත් වේ.
උදා:- බටනළාව, හක්ගෙඩිය, හොරණෑව

වාදනය කරන අවස්ථා

ආගමික උත්සව (පෙරහැර, පිරිත් පින්කම්, තේවාවාදන)

සමාජීය උත්සව (ශාන්තිකර්ම, තූර්යවාදන, සන්දර්ශන ජාතික උත්සව,අවමංගල්‍ය උත්සව)

**ඇගයීම**

1. වාදනය කරන ආකාරය අනුව වාද්‍ය භාණ්ඩ වර්ග කර දක්වන්න.
2. වර්ගීකරණයට අනුව එම වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්ථා නම් කරන්න.
3. පහත වගුව සම්පූර්ණ කරන්න.

| දැතින් වයන භාණ්ඩ | කඩිප්පුවලින් වයන භාණ්ඩ | අතින් හා කඩිප්පුවෙන් වයන භාණ්ඩ | ලෝහමය ද්‍රව්‍ය වලින් නිමවා ඇති භාණ්ඩ | සුළගේ ආධාරයෙන් වයන භාණ්ඩ |
|---|---|---|---|---|
| | | | | |

# 4 පරිච්ඡේදය

## 4.1 කඩතුරා කවි ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම

උඩරට, පහතරට හා සබරගමු යන සම්ප්‍රදාය තුනට ම පොදු ගායනා විශේෂයකි. බෞද්ධාගමික මුහුණුවරක් ගායනාවල අන්තර්ගත ව ඇත. ශාන්තිකර්මවල දී සුදු පිරුවටයක් ලෙස රංග සැරසිල්ල ආවරණයට භාවිත කරන තාවකාලික ආවරණය කඩතුරාව ලෙස හැඳින්වේ. විවිධ වූ නාදමාලා අනුව මෙම කවි ගායනය කෙරේ.

- ග්‍රාමීය ජන සමාජයේ අවශ්‍යතා පූර්ණ කිරීමට යොදාගනී.
- විශේෂයෙන් සෙත් ශාන්තිය අපේක්ෂාවෙන් කෙරෙන ගෘහස්ථ හා පොදු ශාන්තිකර්මවලටද යොදා ගනී.
- සමාජ විශ්වාස හා බැඳුණු මානව ආකල්ප මගින් මේවාට ප්‍රමුඛ බවක් ලබා දිනි.
- කවි ගායනාවල බෞද්ධාගමික ලක්ෂණ ඇතුළත් ය.
- සිංහල සංස්කෘතිය හා බැඳුණු සාරධර්ම, චාරිත්‍ර විධි ඇතුලත් අවස්ථාවල දී මේවා භාවිත වී ඇත.

මාත්‍රා 3 තාලය

සිහින් සිනිඳු සළුව පැලඳ විත් උන් මරඟන
වහන්ස නුඹ අප අතහැර මන්ද මහණ වුණ
අහංකාර ඒ මරඟන දැක්කා බුදුගුණ
මිහින්තලා ධාතු බලෙන් කඩතිර අරිමින

සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝමුල විදුරාසන
යුද්ධ කරන්නට දසබිම්බර විත් පැරදුණ

වැද්ද නොදී හැම පිරිපත දුරලා		හරිමින
බුද්ධ රත්න අනුහසයෙන් කඩතිර		අරිමින

## ගොයම් කැපීමේ ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම

කෘෂිකාර්මික ජන සමාජය තුළ ජීවත් වූ මිනිසා තම වෘත්තිය ලෙස වී ගොවිතැන යොදාගෙන ඇත. මෙම කාර්යයෙහි යෙදෙන ගොවියා තම ශරීරයට දැනෙන වෙහෙස, මහන්සිය, විඩාව ,පාළුව මඟහරවා ගැනීම පිණිස ගොයම් කැපීමේ කවි ගායනා කරයි. මෙය ගැමි ජනතාවගේ සහජීවනය ඉස්මතු කරන සාමූහික ක්‍රියාවලියකි. ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම මෙන් ම ඔවුන් තුළ පවතින විශ්වාස පහත කවිවලින් ගම්‍ය වේ. සරල තාලරූප හා නාදමාලා අනුව ගැමි බස් වහර පිළිබිඹුවන පරිදි මෙම කවි නිර්මාණය වී ඇත.

රන් දැකැති ගෙන නිති		සැරසෙනවා
රත්රන් පටි ඉණවට		දිලිසෙනවා
රිවි දුටු පිනි බිඳු ලෙස		පහවෙනවා
දුම්බර කෙතෙ අපි ගොයම්		කපනවා

ඉරු දෙවියන්ගේ ඉරගල		ගාවා
සඳ දෙවියන්ගේ සඳගල		ගාවා
ගණ දෙවියන්ගේ කෝවිල		ගාවා
අපිත් කියමු කවි ගොවිපළ		ගාවා

උදේ සිටන් වකුටු කොන්ද දිග		හැරපල්ලා
අතේ තියෙන ගොයම් මිටිය බිම		දමපල්ලා
හිසේ තියෙන ලේන්සු පොඩි අතට		ගනිල්ලා
සතර වරම් දෙවි පිහිටෙන් ගොඩ		පලයල්ලා

එපා කියන තැන තැන		නොසිටිල්ලා
පිපාස නම් දියවර		බීපල්ලා
අපාසු නම් සෙවණේ		සිටපල්ලා
කපා ගොයම් කඩිනම්		කරපල්ලා

## පන් නෙළීමේ කවිවල සමාජයීය හා සංස්කෘතික පසුබිම

පන් කර්මාන්තයට අදාළ ව පන් නෙළීමේ කවි නිර්මාණය වී ඇත. ගැමි ජනයා තුළ පවතින සාමූහිකත්වය, එකමුතු බව හා සුහදතාව මෙම කවි ගායනා මඟින් විද්‍යාමාන වේ. ඇතැම් ශාන්තිකර්මවල පන්නෙළීමේ කවි ගායනා අන්තර්ගත වී ඇති අතර ඒවා සරල තාලයකින් ද නාදමාලාවලින් ද යුක්ත වේ.

මාත්‍රා 3 තාලය

ගාන තෙල් සඳුන් වරලස ඔමරි		කොට
මුහුණ පුරා තෙල් ගාගෙන යන		කලට
මාන බලති මිනිවන් පන් තිබෙන		කොට
නෑනෙ නුඹත් එනව ද පන්		නෙළන්නට

කොනින් කොනට පන් උදුරා		ගන්නේ
තැනින් තැනට පන් අහුරු		දමන්නේ

අනුන්ගෙ පන් කොළ එක්  නොකරන්නේ
බැණුන් අහන්නට වෙයි  දැනගන්නේ

මාත්‍රා 3 තනිතත හෝ මාත්‍රා 2 +4 දෙතිත හෝ තාලය
ඉරසඳ පාන විල කොතැන ද  තුන්හිරියා
ඉරසඳ පාන විල මෙතැනයි  තුන්හිරියා
පන් කම් කරන අඟනෝ කාටත්  සරියා
මට පැදුරකට පන් දෙනව ද  තුන්හිරියා

සොකරි කවිවල සමාජ හා සංස්කෘතික පසුබිම

උඩරට වන්නි ගැමි සමාජයෙහි ප්‍රචලිත සොකරි නාටකයේ දී මෙම කවි ගායනය කරනු ලබයි. සොකරි නාටකයේ අන්තර්ගත චරිත මූලික කොට ගෙන එහි කතා ප්‍රවෘත්තිය විකාශනය වන්නේ කවි ගායනා මගිනි. එබැවින් සොකරි නාටකයෙහි ආරම්භයේ සිට අවසානය දක්වාම කවි ගායනා කරනු ලැබේ. ඒවා සරල ඒකාකාරී නදරටාවකින් යුක්තවේ. සියලුම කවි ගායනා කරනු ලබන්නේ මාත්‍රා 3 තනි තිතට අයත් "දොං ජිජිගත" බෙර පදයේ තාලයට අනුවය.

වෙදා නටන්නේ පළමු ව සබයට  එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත  වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක්  හඬලන්නේ
විදා පාන්නේ අත්දෙක තැගි  තියන්නේ

සොකරි එන්නී සබයෙන් අවසර  ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග  තියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම  සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මුහුණ  බලන්නී

ලාහක් විතර වී අච්චේ  වනාලා
දොළසක් විතර පෙති ගෝමර  ඉසීලා
අතක් දිගට නිල් වරලස  මුදාලා
සොකරි සිටී වී අච්චේ  වනාලා

## 4.2 නියමිත තිත් රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනය

මෙම ක්‍රියාකාරකම සැලසුම් කරගැනීමේ දී අදාළ ගායනා සඳහා 2.4 නිපුණතාවයට ඇතුළත් පිටු අංක 24 සිට 29 දක්වාත් 4.1 නිපුණතාවට ඇතුළත් පිටු අංක 39,40,41 දක්වාත් ඇසුරු කරගන්න.

# 5 පරිච්ඡේදය

### ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගවේශනයේ දී උපයෝගී කරගත හැකි මූලාශ්‍රය වර්ග කීපයක් යටතේ සාකච්ඡා කළ හැකි ය.

- වංශකථා
- රූකම්
- සෙල්ලිපි
- සන්දේශ කාව්‍ය
- සාහිත්‍ය කෘති
- දේශ සංචාරකයන්ගේ වාර්තා ශ්‍රී ලාංකේය නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු, මූලාශ්‍රය වශයෙන් ගෙන විමසීම වඩාත් වැදගත් වේ.

ඉහත මූලාශ්‍රය යටතේ සෙල්ලිපි, සන්දේශ කාව්‍ය ඇසුරින් නර්තන කලාව පැවති බවට සාධක

කීපයක් හඳුනාගත හැකි ය.

| යුගය | මූලාශ්‍රය | සාධක |
|---|---|---|
| අනුරාධපුරය | සෙල් ලිපි/ලෙන්ලිපි | • ක්‍රි.ව. 1-2 සියවස්වලට අයත් සැස්සේරුව සෙල්ලිපියේ<br>• නටන ගහපතියා විසින් පවරා දෙන ලදි යනුවෙන් සඳහන් වේ.<br>**කොරවක්ගල ලෙන් ලිපිය**<br>නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදි යනුවෙන් සඳහන් වේ.<br>මෙහි 'ගහපතියා' යනුවෙන් දැක්වෙන්නේ නැටුම් පරම්පරාවක් සිටි බව ය. |
| පොළොන්නරුව | සෙල් ලිපිය | **පාලමොට්ටායි සෙල් ලිපිය**<br>• මෙම ශිලා ලිපිය අනුව දේවදාසීන් සිටි බවත් ඔවුන් නැටූ බවත් ලංකාව සොළීන්ට යටත් වූ පසුව මෙවැනි ආකාරයට දෙවියන් උදෙසා පූජා නැටුම් පැවැත්වීම ආරම්භ වූ බවත් පෙනේ. මෙම ලිපියට අනුව නළලෙහි සලකුණු තබා දේවදාසීන් හත්දෙනකු පිදූ බවත් ඔවුන්ට තැන්පත් කළ මුදලක පොළියෙන් කාසි ගෙවූ බවත් කියැවේ.<br>• කාලිංග වනයෙහි නෘත්‍ය ගීත බලා වැඩහිඳිනා සිංහාසනය යි, යනුවෙන් කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපියේ සඳහන් වේ. |
| ගම්පොළ | සන්දේශ කාව්‍ය | **තිසර සන්දේශය**<br>• තිසර සන්දේශ කාව්‍ය 14 වැනි සියවසේ ලියන ලද බව පිළිගැනේ. මෙහි වාද්‍ය භාණ්ඩ හා නර්තන අංග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.<br><br>තහලම් තල බෙර තම්මැට පට තන්තිරි ඩමුරු<br>තඹ මේ ඩැක බෙර බොම්බිලි වීණා මිණි සුසිරු<br>බෙර මද්දල කහලම් රසු නිගළම් බඳ සොඳුරු<br>මෙසියල් මහ ගිගුමෙන් පළ කෙරෙමින් සිඳු අයුරු<br><br>නිලුපුල් දිගැසී තන රණ කලසී<br>විදුලිය සදිසී සියුමැලි දිගැසී<br>රඟ බැස නොලසී රඟ දෙන විලසී<br>දුටු එම විගසී මද තෙම ඇවිසී |

| කෝට්ටේ | | **සැළලිහිණි සන්දේශය**<br><br>විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී<br>හෙළන නගන අත නුවනග බැලුම් දිදී<br>රුවන දිලෙන අබරණ කැලුම ගත යෙදී<br>සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී<br><br>ලකල පුළුලුකුල බැඳි මිණි මෙවුල්ලා<br>සමඟ රන් සළඹ රැවු දී වෙවුල්ලා<br>වයන පදට තබමින් පද කමල්ලා<br>රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා<br><br>**පරෙවි සන්දේශය**<br><br>ලෙළදුන් නව තඹ පලු වන් පාදේ<br>තබමින් නිවරද මද්දල නාදේ<br>ගයමින් පානා ගීයෙන් කීදේ<br>අඟනන් රඟ දුටුවන් සිතු පැදේ<br><br>ලෙළෙනා දිගු නෙත නිලුපුල සේයා<br>ලෙළ පවනින් රන් ලිය විලසේයා<br>නළඟන රඟනා දැක නොලසේයා<br>නළඟන නුවනත රඟ සැලැසේයා |
|---|---|---|

කාර්‍ය පත්‍රිකාව

1. නර්තන කලාව හා බැඳි සෙල් ලිපි හා සන්දේශ කාව්‍ය ඇතුළත් යුග නම් කරන්න.

| සන්දේශ කාව්‍ය / සෙල් ලිපි /ලෙන්ලිපි | යුගය |
|---|---|
| • සැස්සේරුව හා කොරවක්ගල | ............................................ |
| • පාලමොට්ටායි /කාලිංග වනයෙහි ගල් ආසන ලිපිය<br>........................................ | |
| • තිසර සන්දේශය | ........................................... |
| • සැළලිහිණි සන්දේශය | ............................................. |
| • පරෙවි සන්දේශය | ....................................... |

2. නර්තන කලාව පැවති බවට සන්දේශ කාව්‍ය ඇසුරින් සාධක දෙකක් විස්තර කරන්න.
3. සාහිත්‍ය කෘතියක් ලෙස සන්දේශ කාව්‍ය අගයමින් ඔබේ අදහස් දක්වන්න
4 පාලමොට්ටායි සෙල් ලිපිය ඇසුරින් නර්තන කලාව පැවති ආකාරය පළිබඳව විස්තර කරන්න

සන්දේශ කාව්‍යන්හි එන කවියක් නාද මාලාව, තාල ලක්ෂණ, කාව්‍ය අර්ථය ඇසුරු කරමින්
කෙටි නර්තනයක් ප්‍රකාශාත්මක ව ඉදිරිපත් කරන්න.
උදා- විදෙන ලෙළෙන නරු බර පුළුලුකුළ රැඳී



උදා -

## ශාන්තිකර්ම

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික හෝ සුභ සිද්ධිය අරමුණු කොට දෙවියන්, යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

### දේශීය නර්තන සම්ප්‍රදාය තුනට අයත් ශාන්තිකර්ම

| සම්ප්‍රදාය | ශාන්තිකර්මය |
|---|---|
| උඩරට නර්තන සම්ප්‍රදායය | කොහොඹා කංකාරිය |
| පහතරට නර්තන සම්ප්‍රදායය | දෙවොල් මඩු ශාන්තිකර්මය |
| සබරගමු නර්තන සම්ප්‍රදායය | පහන් මඩුව ශාන්තිකර්මය |

### ශාන්තිකර්ම පැවැත්වීමට හේතු වූ කරුණු

**උඩරට කොහොඹා කංකාරිය ශාන්තිකර්මය**

අතීතයේ පැවැත්වීමට හේතුව

- පඬුවස් දෙව් රජුට වැදුණු දිවිදොස් නිසා හටගත් රෝග සුවපත් කිරීම

වර්තමානයේ පැවැත්වීමට හේතුව

- ධන, ධාන්‍ය, ගව, මහිෂාදි භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම
- පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයන් සුව කර ගැනීම
- ගමකට, ප්‍රදේශයකට, මුළු රටට ම පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම
- ආධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යයන හා

**පහතරට දෙවොල් මඩු ශාන්තිකර්මය**

අතීතයේ පැවැත්වීමට හේතුව

- සේරමාන රජුට ඇති වූ හිසරදය සුව කිරීම

වර්තමානයේ පැවැත්වීමට හේතුව

- ගමට රටට සෙත් ශාන්තියක් පැතීම
- සශ්‍රීකත්වය උදෙසා
- රෝග නිවාරණය සඳහා සෙත් ශාන්තියක් ලෙස
- අධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යයනය හා පර්යේෂණ සඳහා)

**සබරගමුව පහන් මඩුව ශාන්තිකර්මය**

**අතීතයේ පැවැත්වීමට හේතුව**

- සේරමාන රජුට ඇති වූ හිසරදය සුව කිරීම

**වර්තමානයේ පැවැත්වීමට හේතුව**

- අම්මාවරුන්ගේ ලෙඩ ලෙස ගැමියන් හඳුන්වන රෝගවලින් අත්මිදීම සඳහා
- ගමට රටට සෙත් ශාන්තියක් පැතීම
- ආධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යයනය හා පර්යේෂණ සඳහා)
- ධන, ධාන්‍ය, ගව, මහිෂාදි භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම

**ශාන්තිකර්මවල පුද ලබන දෙවිවරු**

| සම්ප්‍රදාය | ප්‍රධාන ශාන්තිකර්මය | පුද ලබන දෙවිවරු |
|---|---|---|
| උඩරට | කොහොඹාකංකාරිය | කොහොඹා දෙවියෝ<br>අලුත් කොහොඹා,<br>මහ කොහොඹා,<br>පරණ කොහොඹා යන<br>කොහොඹා දෙවි තුන්<br>කට්ටුව |
| පහතරට | දෙවොල් මඩුව | පත්තිනි දේවතාවිය<br>දෙවොල් දෙවියෝ<br>දැඩිමුණ්ඩ දෙවියෝ<br>දොළහ දෙවියෝ |
| සබරගමු | පහන් මඩුව | පත්තිනි දේවතාවිය<br>විෂ්ණු දෙවියෝ<br>සමන් දෙවියෝ<br>කතරගම දෙවියෝ<br>විභීෂණ දෙවියෝ<br>නාථ දෙවියෝ<br>දෙවොල් දෙවියෝ<br>වාහල දෙවි |

## කොහොඹා කංකාරියේ පුරාවෘත්තය

විජය රජු කුවේණිය සරණ පාවා ගෙන වාසය කිරීමේ දී ඔහුට ජීවහත්ත සහ දිසාලා නම් දරු දෙදෙනා උපදිති. ඉක්බිති ඔහු කුවේණිය පලවා හැර මදුරාපුරයෙන් ගෙන්වා ගත් සම කුල කුමාරියක සරණ පාවා ගනී. විජය රජු කෙරෙහි කෝපයට පත් කුවේණිය ඔහුට ශාප කළා ය. විජයගේ ඇවෑමෙන් රජ පැමිණි පඬුවස් දෙව් රජුට, කුවේණිය විසින් විජය රජුට කරන ලද ශාපය වැදිණි.

සිහිනෙන් දිවි වෙසක් දැක බියපත් වූ පඬුවස් දෙව් රජු බලවත් සේ රෝගාතුර විය. කොහොඹා කංකාරියේ දිවි දෝෂය නමින් හැඳින්වෙන්නේ මෙය යි. මෙම දිවි දෝෂය දුරු කිරීම සඳහා නොයෙකුත් සෙත් ශාන්ති කරවන ලද නමුත් සුවයක් නො ලැබිණි. අනතුරු ව ශක්‍ර දේවේන්ද්‍රයාට මෙය සැල කර සිටියේ ය. දිවියකු සිහිනෙන් දැක බිය වීමෙන් හටගත් රෝගයක් හෙයින් මවු කුසෙන් උපන් කෙනෙකුට දුරු කළ නොහැකි නිසා මලෙන් උපන් කෙනෙකු සොයා යාගය කරන ලෙස උපදෙස් දෙන ලදි.

මෙම කාර්යය රාහු අසුරේන්ද්‍රයාට භාර කරන ලදී. රාහු අසුරේන්ද්‍රයා විෂ්ණු දෙවියන්ගේ දස අවතාරවලින් එකක් වන දියෙන්, ගින්නෙන්, ආයුධවලින් හෝ හීයකින් හෝ නො නස්නා බල ඇති ඌරු අවතාරය ලබා දෙන්නේ නම් කාර්යය භාර ගන්නා බව කියා සිටියේ ය. අවසරය ලැබුණු රාහු අසුරේන්ද්‍රයා සත් මුහුදෙන් එතෙර වී, මලය රටට ගොස් රජුගේ නන්දන උයන විනාශ කරන්නට පටන් ගති. උයන ආරක්ෂා කරන උයන් පල්ලා සිදු ව ඇති විපත මලය රජුට දැන්වී ය. රජු ඌරා ඇල්ලීම සඳහා නුවර අණබෙර ලවා වැදි සේනාව රැස් කර උයන වට කළේ ය. ඌරා මලය රජුගේ නුවරට වැද මාළිගා බිඳ දුවන විට මලය රජු, කිත්සිරු, සඳලිඳු යන තුන්දෙන අතින් දුනු හී ගෙන ඌරා ලුහුබැඳ ලක්දිව පැමිණියේ ය. සත් මුහුද පීනා ගිය ඌරා ලක්දිවට පැමිණ හන්තාන කන්ද අසල දී ගලක් බවට පත් විය. මලය රජු කඩුවෙන් කොටා විස්මයට පත් වූ අවස්ථාවේ එතැනට පැමිණි සක්දෙව් රජු මලය රජු ඇතුළු පිරිස මෙහි ගෙන්වීම පිණිස මෙවැනි මායාවක් කළ බවක් විස්තර කළේ ය. මලය රජු ඇතුළු පිරිස පඬුවස් දෙව් රජුගේ දිවි දොස් සුවපත් කිරීම පිණිස අනුරාධපුරයේ මහමෙවුනා උයනේ නියමිත දිග පළල සහිත මණ්ඩපයක් කරවා ශාන්ති කර්මය කිරීමෙන් අනතුරු ව දිවි දෝෂය සුවපත් විය.

## දෙවොල් මඩුවේ පුරාවෘත්තය

සේරමන් රජුගේ උයන පාළුකරමින් සිටි ගෝනකු මරා දමන ලෙස රජු විසින් අණ කරන ලදින් හේවායින් ගෝනා පසුපස පන්නා යන අවස්ථාවේ ගෝනාගේ පය පැටලී අසල තිබුණ රජුගේ පොකුණ තුළට වැටී මරණයට පත් විය. තමාට විපත් කළේ රජු බව දැනගත් ගෝනා ඔහු කෙරෙහි කෝපයෙන් මරණයට පත් වී පොකුණෙහි ම කුඩා මැඩියකු වී උපදී. දිනක් රජු පොකුණට යද්දී ලස්සණ මලක් දැක එය කඩා සුවඳ ආඝ්‍රාණය කළ සැණෙකින් එහි සිටි කුඩා මැඩියා රජුගේ නාසයට ගියේ ය. ඉන් හටගත් හිසරදයක් සුව කිරීමට නොහැකි ව සිටිය දී දිනක් රජුට සිහිනෙන් රූමත් කාන්තාවක් පෙනුණා ය ය. ඒ බව පුරෝහිතයන්ට දැන්වී ය. ඔවුන් පැවසුවේ සිහිනයෙන් පෙනී ඇත්තේ පත්තිනි දේවිය බවත් බෞද්ධාගම ස්ථාපිත රටකට ගොස් පින් පැමිණවිය යුතු බවත් ය. එහි දී ලංකාව තෝරා ගෙන කැලණියට ගොස් බුදුන් වැඳ දෙවියන්ට පින් දී රුවන්වැල්ලේ දී දෙවොල් මඩුව ආරම්භ ක ළ බව කියැවේ.

*** සබරගමු පහන් මඩුවේ පුරාවෘත්ත කතාව පහතරට දෙවොල් මඩුවේ පුරාවෘත්ත කතාව හා බැඳේ.**

# 5.3 ශ්‍රී ලංකේය නර්තන කලාවේ ප්‍රවර්ධණයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි

## විල්සන් ඔලබොඩුව ගුරුතුමා

කළුතර දිස්ත්‍රික්කයේ ඔලබොඩුව නම් ග්‍රාමයෙ ජන්ම ලාභය ලද විල්සන් ප්‍රනාන්දු හෙවත් විල්සන් ඔලබොඩුව මහතා පහතරට නර්තන සම්ප්‍රදායයේ රයිගම් ශෛලිය ප්‍රගුණ කළ නර්තන හා වාදන ශිල්පියෙකි. නර්තන ශිල්පය මෙන් ම වාදන ශිල්පය පිළිබඳ ව ද අත දක්ෂතා ප්‍රකට කළ මෙතුමා උඩරට හා පහතරට බෙර වාදනය මෙන් ම පෙර අපර දෙදිග විවිධ තූර්ය භාණ්ඩ වාදනය කිරීමේ දක්ෂතා දක්වූ වෙක් විය.

60 දශකයේ මුල් භාගයේ දී රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය ට (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය) කථිකාචාර්යවරයකු ලෙස පත් වූ මෙතුමාගෙන් පහතරට නර්තන සම්ප්‍රදායයට සිදු වූ මෙහෙය සුලුපටු නොවේ.

විධිමත් ව නොපැවති පහතරට නර්තනයේ හස්ත පාද ක්‍රමවත් ව ගොඩ නැඟීම විල්සන් ඔලබොඩුව මහතාගෙන් සිදු වූ එක් මහඟු මෙහෙවරකි.

එවකට එකී ආචාර්ය මණ්ඩලයේ කටයුතු කළ එස්.එල්.එච්.ප්‍රනාන්දු, කේ.ඇස්. ප්‍රනාන්දු සහ සච්රිස් සිල්වා යන අය සමඟ එක් වී පහතරට නර්තනයේ එතෙක් නොපැවති පා සරඹ හා ඉළංගම් සරඹ නමින් සරඹ පද්ධති දෙකක් නිර්මාණය කිරීමේ ගෞරවය ද එතුමාට හිමි විය යුතු ය.

එසේ ම මාතර හා බෙන්තර ශෛලි වශයෙන් පැවති ශුද්ධ මාත්‍රා නැටුමේ පද කොටස් එක් කොට වත්මනෙහි භාවිතයේ පවතින ශුද්ධ මාත්‍රය නිර්මාණය කළේ ද දෙවොල් පද හත හා සුරල් හත ක්‍රමවත් අයුරින් සකස් කළේ ද විල්සන් ඔලබොඩුව මහතාගේ ප්‍රමුඛත්වයෙනි.

සාම්ප්‍රදායික නර්තන අංග මෙන් ම නව නර්තනාංග කීපයක් ම නිර්මාණය කොට,''රංගලීල'' නමින් නර්තන ප්‍රසංගයක් පැවැත්වීම ද පහතරට නර්තන කලාවට එතුමාගෙන් සිදු වූ තවත් මහඟු මෙහෙවරක් ලෙස සැලකිය හැකි ය.

## අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා

ඉසෝහාමි හා පොඩි සිංඤෝ යුවළට උපන් දරුවන් දොළොස් දෙනාගෙන් දෙවන පුතා වන අර්නෝලිස් 1925 ගලපිටමඩ ඉඹුල්ගොඩ උපත ලද්දේ ය. 8 වැනි ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලද අර්නෝලිස් මංගලතිරිය ගුරුතුමාගෙන් න්‍ර්තනය ගායනය ප්‍රගුණ කළේ ය. අනතුරු ව අල්ගම කිරිගණිත ගුරුතුමාගෙන් උඩරට නර්තනය හැදෑරූ ඔහු දක්ෂ නර්තන ශිල්පියකු බවට පත් විය.

ලංකා ගාන්ධර්ව විභාගය සමත් වී සිටි ඉඹුල්ගොඩ 1951 දී බෙන්තොට ගාමිණී විද්‍යාලයේ නැටුම් උපදේශක ලෙස පත්විය. මේ අතර ඉන්දියාවට ගිය මොහු ශ්‍රී ගෝපි නාත් යටතේ කතකලි නැටුම පිළිබඳ පුහුණුවක් ලැබීය.

රංජනා තංගරාජා යන අය සමග එක් වී විජයාවතරණය, ජානකීහරණය සහ උන්මාද චිත්‍රා යන මුද්‍රා නාට්‍යවල රඟ පෑ ඉඹුල්ගොඩ 1957 උදාව නම් මුද්‍රා නාට්‍යය ද 1961 වේදනා නමැති මුද්‍රා නාට්‍යය ද 1968 රන්දද නමැති මුද්‍රා නාට්‍යය ද නිෂ්පාදනය කළේ ය.

1954 බලපිටිය ගුරු විදුහලේ නැටුම් කථිකාචාර්යවරයකු ලෙස පත් වූ මොහු පසුව 1956 රජයේ ලලිත කලායතනයේ කථාකාචාර්යවරයකු ලෙස කටයුතු කළේ ය. විශ්වවිද්‍යාලයීය ආයතනයක් බවට පත් වූ එම ආයතනයේ ද සේවය කළ ඉඹුල්ගොඩ අතිදක්ෂ උඩරට නර්තන ශිල්පියෙකි. සෙසු නර්තන ශිල්පීන්ට වඩා ඔහුට ම ආවේණික වූ ශෛලියක් අනුව නර්තනය ගොඩනගා ගැනීම මොහුගේ සුවිශේෂතාවක් ලෙස හැඳින්විය හැකි ය. ඒ මඟින් උඩරට නර්තන කලාවෙහි ප්‍රාසංගික භාවය ඉස්මතු කරමින් සම්ප්‍රදාය ට හානියක් නොවන සේ නර්තන නිර්මාණයෙහි යෙදෙමින් උඩරට නර්තන කලාවේ ප්‍රගමනයට ශ්‍රේෂ්ඨ දායකත්වයක් ලබාදීමට කටයුතු කළ ශිල්පියෙකි. මොහුගේ නිර්මාණකරණයේ දී තාලයේ හා රිදමයේ සුසංයෝගයෙන් අපූර්ව සුන්දරත්වයක් මතු කර ගැනීමට සමත් විය. උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් ශාස්ත්‍රීය නර්තන අංග ඒකාකාරි රටාවෙන් බැහැර ව සාම්ප්‍රදායික ලක්ෂණයන්ට සහ එහි අනන්‍යතාවන්ට හානියක් නොවන ආකාරයට වඩාත් ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීම ද ඔහුගෙන් සිදු වූ තවත් සේවාවක් ලෙස හැඳින්විය හැකි ය. මෙහි දී භාරතීය නර්තනයේ විවිධ හැඩතල හා රිද්ම එක් කොට නවත ම සජීව නර්තන ශෛලියක් බිහි කළේ ය.

මොහු ඉතා දක්ෂ ගායකයෙක් ද වූයේ ය. බෲනායි, තායිලන්තය සහ ජර්මනිය යන රටවල සංචාරය කරමින් උඩරට නැටුමේ අගය ලොවට හෙළි කළේ ය. 1986 දී ඔහු ජනාධිපතිවරයා අතින් කලාභූෂණ සම්මානය ද හිමි කර ගත්තේ ය.

# 6 පරිච්ඡේදය

## කථක් නර්තන සම්ප්‍රදායය

කථක් නර්තනය උතුරු ඉන්දියාවේ පාරම්පරික ව පැවත එන ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදායයකි. කථාවක් කීම යන අරුත ඇති කථක් හෙවත් කථක යන සංස්කෘත නාමයෙන් මෙය ඇති වූ බව කියැවේ. නර්තනය මාධ්‍යය කරගෙන මුද්‍රා භාවිත කරමින් තාල, රිද්ම අනුව අංග, ප්‍රත්‍යංග, උපාංග උපයෝගී කරගනිමින් භාව ප්‍රකාශනය සහිත ව/රහිත ව කථාවක් රඟ දැක්වීම කථක් නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන ලක්ෂණයකි. කථක් නර්තනයේ නෘත, නෘත්‍ය, නාට්‍ය යන අංග තුන ම දක්නට ලැබේ.

කථක් නර්තනය මුල් කාලවල දී හින්දු සංස්කෘතික ලක්ෂණ අනුව ගොඩනැගුණ නමුත් මෝගල් අධිරාජයාගෙන් පසු ව මුස්ලිම් ආභාසය ලබමින් විවිධ විපර්යාසයන්ට ලක් විය. මේ අනුව ආගමික හා සමාජ සංස්කෘතික ලක්ෂණවලට අනුකූල ව නර්තන ගොඩ නැගෙන්නට ඇත. ස්ත්‍රී, පුරුෂ දෙවර්ගය ම කථක් නර්තන රඟ දැක්වූ අතර රාජ සභාවන් හි ද දක්නට ලැබුණු බව සඳහන් ය.



### පවතින ප්‍රදේශ

කථක් නර්තනය උත්තර භාරතීය නර්තන සම්ප්‍රදායයක් වන අතර මහා රාෂ්ට්‍රය, ගුජරාට්, රාජස්ථාන්, දිල්ලි, ලක්නව් ප්‍රදේශවල ප්‍රචලිත ව පවතී.



**කථක් නර්තන සරානා (ගුරුකුල)**

**කථක්** නර්තන ප්‍රධාන වශයෙන් **සරානා** හතරකි.මෙම **සරානා** එක් එක් ප්‍රදේශවල ප්‍රචලිත වූ අතර විවිධ පුද්ගලයන්ගේ දායකත්වය අනුව ගොඩ නැගුණි.

1.ලක්නව් සරානා :- නවාබ් වජීඩ් අලීෂා 19 වැනි ශතවර්ෂයේ දී ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයකි.

2. ජායිපූර් සරානා :- ජායිපූර් ප්‍රදේශයේ ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයකි.

3. බෙනාරිස් සරානා :- බෙනාරිස් ප්‍රදේශයේ ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයකි.

4. රායිගර් සරානා :- රායිගර් ප්‍රදේශයේ ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයකි.




නවාබ් වජීඩ් අලීෂා රජු



චක්‍රධාර් සිංග් රජු

**සංගීත සම්ප්‍රදායය**

උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රදායය කථක් නර්තනයේ සංගීත සම්ප්‍රදායය යි.[P] . රාග පදනම් කරගත් සංගීතය භාවිත කරන අතර වාදනය සඳහා තබ්ලාව, පක්වාජ්, සර්පිනාව, සිතාරය තාම්පුරාව, සාරංගිය හා බටනළාව භාවිතයට ගැනේ.



තබ්ලාව



සර්පිනාව (හාර්මෝනියම්)



බටනළාව







තාම්පුරාව



සිතාරය

**රංග වස්ත්‍රාභරණ**

කථක් නර්තනය සඳහා භාවිතයට ගන්නා රංග වස්ත්‍ර හින්දු හා මුස්ලිම් සංස්කෘතිය අනුව සකස් වී ඇත. දැනට වඩාත් භාවිත වන්නේ රාජ්පුට් වංශවතුන්ගේ ඇඳුමට සමාන වූ රංගවස්ත්‍ර ය.



හින්දු සංස්කෘතිය අනුව සකස් වූ රංගවස්ත්‍රාභරණ කට්ටලය



මුස්ලිම් සංස්කෘතිය අනුව සකස් වූ රංගවස්ත්‍රාභරණ කට්ටලය



නර්තන ශිල්පියකුගේ රංගවස්ත්‍රාභරණ කට්ටලය

අධ්‍යාපන ආයතන




### දිල්ලි කථක් කේන්ද්‍රය

1964 හින්දුස්ථානි සංගීත ආයතනයක් ලෙස ආරම්භ කළ අතර වර්තමානයේ කථක් නර්තන සඳහා විශේෂ වූ ආයතනයකි. නර්තන, නාට්‍ය යන අංග මෙහි හැදෑරිය හැකි ය. අග්‍රගණයේ කථක් නර්තන ශිල්පීන් රාශියක් මෙහි සේවය කර ඇත.



### භාත්ඛණ්ඩේ විශ්වවිද්‍යාලයය

1926 සංගීත ආයතනයක් ලෙස ආරම්භ කළ මෙම ආයතනය කලාකරුවන් රාශියක් බිහි කර ඇත. වර්තමානයේ සංගීතයට අමතර ව කථක්, භරත නාට්‍යම් හා මනිපුරි නර්තන මෙහි හැදෑරිය හැකි ය.

## කථක් නර්තන අංග

- භූමි වන්දනා
- ආමද්
- සලාම්
- බෝල්
- පරන්
- චක්‍රධාර්
- ගත්
- තත්කාර්




භූමි වන්දනා

# කථක් නර්තන ප්‍රවර්ධනයට දායකවූ ශිල්පීහු

නවාබ් වලිජ් අලීෂා



අවාද් රටේ 5 වැනි රජු ලෙස කටයුතු කළ මොහු 1822 දී උපත ලැබී ය.නර්තනය,නාට්‍ය,සංගීතය හා කථා ප්‍රභන්ධයට දක්ෂතා දක්වා ඇත. මුල් කාල වකවනුවල දී ආගමික සිද්ධස්ථානවලට සීමා වූ කථක් නර්තනය රාජ සභාවන් හි රඟ දැක්වීමට කටයුතු කළේ ය. එමෙන් ම කථක් නර්තනය සම්බන්ධ ව ග්‍රන්ථ රචනා කර ඇත.

අච්චන් මහරාජ්



බිර්ජු මහරාජ්ගේ පියා අච්චන් මහා රාජ් ය. පාද චලන මෙන් ම භාව ප්‍රකාශනය හා නෘත්ත ලක්ෂණ මැනැවින් දැක්වීමට හැකි දක්ෂ ශිල්පියෙකි. රාජ සභාවන්හි නර්තන දක්වා ප්‍රශංසා ලබා ඇත.

බිර්ජු මහාරාජ්



සංගීත් භාත්ඛණ්ඩ ආයතනයේ හා කථක් කේන්ද්‍රයේ ගුරුවරයෙක් ලෙස සේවයකර ඇත් අතර කථක් නර්තන අංග රාශියක් නිර්මාණය කර ඇත. නෘත, නෘත්‍ය ගණයේ නර්තන දැක්වීමට පරිපූර්ණ කුසලතා හිමි කරගත් ඔහු සංගීත නිර්මාණය, සිනමා සඳහා අංග රචනය ආදියෙන් දායකත්වය දක්වා ඇත. එමෙන් ම රාජසම්මාන රාශියක් ලබා ඇත.

කාර්ය පත්‍රිකාව

1. කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශ 2ක් නම් කරන්න.
2. කථක් යන වචනාර්ථය විස්තර කරන්න.
3. කථක් නර්තනයේ ආගමික පසුබිම හඳුන්වන්න.
4. කථක් නර්තන ශෛලි හතර (ඝරානා) නම් කරන්න.
5. කථක් නර්තනය පිළිබඳ ග්‍රන්ථ රචනා කළ රජු නම් කරන්න.
6. කථක් නර්තන සම්ප්‍රදායයේ සංගීත සම්ප්‍රදායය නම් කරන්න.
7. කථක් නර්තනයේ රංගවස්ත්‍ර පිළිබඳ හැඳින්වීමක් කරන්න.
8. කථක් නර්තන අධ්‍යාපන ආයතන2 ක් නම් කර විස්තර කරන්න.
9. හින්දුස්ථාන සංගීත වාද්‍ය භාණ්ඩ නම් කර එක් වාද්‍ය භාණ්ඩයක චිත්‍රයක් අඳින්න.
10. කථක් නර්තන අංග 4ක් නම් කරන්න.
11. කථක් නර්තන පිළිබඳ අන්තර්ජාලය හා පොත්පත් ඇසුරෙන් පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

## 6.2 දේශීය නාට්‍ය වර්ග

නාට්‍ය යනු යමක් කර පෙන්වීම යනුවෙන් සරලව හැඳින්විය හැකිය.නාට්‍යයක් ඉදිරිපත් කරන ආකාරය අනුව ශෛලීන් දෙකකි.

1. ලෝක ධර්මී ශෛලිය
2. නාට්‍ය ධර්මී ශෛලිය

ලෝකයේ ස්වභාවයට අනුකූලව නාටයක සතර අභිනය භාවිත වන්නේ නම් එය ලෝක ධර්මීලෙස හඳුන්වයි.මෙහිදී පවත්නා ලෝකයට වඩාත් සමීපව ඉදිරිපත් කිරීමක් දැකිය හැකිය.
ලෝක ස්වභාවයට අනුගත නොවන අයුරින් සතර අභිනය හා
ලංකාවේ නාට්‍ය වර්ග කීපයකි.

- තාත්වික නාට්‍ය
- ශෛලිගත නාට්‍ය
- ගීත නාට්‍ය
- මුද්‍රා නාට්‍ය

**තාත්ත්වික නාට්‍ය**

යථානුරූපී ස්වභාවයෙන් ම ඉදිරිපත් කරන අතර නරඹන්නාට එය තමාගේ අත්දැකීමක් වශයෙන් විඳ ගැනීමට සලසන්නාවූ නාට්‍ය තාත්ත්වික නාට්‍ය ශෛලීය ලෙස හැඳින්වෙයි. කැලණි පාලම, මෝදර මෝල වැනි නාට්‍ය උදාහරණ ලෙස දැක්විය හැකි ය.

**ශෛලිගත නාට්‍ය**

ජීවිතයේ එදිනෙදා දක්නට ලැබෙන විවිධ අවස්ථා හා සිද්ධි සැබෑ ස්වරූපයෙන් බැහැර ව අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය විශේෂයක් ලෙස ශෛලිගත නාට්‍ය හැඳින්විය හැකි ය. තාලය හා රිද්මය පදනම් කොට ගෙන දෙබස් උච්චාරණය මෙන් ම නර්තනය යොදා ගැනීම මෙහි දී දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. ඊට ම ආවේණික වූ ශෛලියක් අනුගමනය කරමින් පොතේගුරු මඟින් චරිත වේදිකාවට කැඳවීම් සමඟ ම ඒ ඒ චරිත වේදිකාවට ප්‍රවිෂ්ට වේ. මෙහි දී අභිනයන් මඟින් චරිත නිරූපණය කිරීම මෙන් ම වෙස් මෝස්තර, ගමන ්තාල යොදාගැනීම ශෛලිගත නාට්‍යයේ දක්නට ලැබෙන තවත් සුවිශේෂ ලක්ෂණයකි.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ මනමේ,සිංහබාහු නාට්‍ය ද හෙන්රි ජයසේන මහතාගේ කුවේණි,හුනුවටයේ කථාව දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑණා, මධුර ජවනිකා යන නාට්‍යද ශෛලිගත නාට්‍ය සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය.

**ගීත නාටක**

නාට්‍යයට අදාළ සියලු ම දෙබස් ගීතයෙන් ඉදිරිපත් කෙරෙන බැවින් එය ගීත නාටක නම් වේ. වාචික අභිනයට ප්‍රමුඛස්ථානයක් ලබාදෙන මෙම ගීත නාට්‍ය රඟ දැක්වීමේ දී නළු නිළියන් විසින් ම ගායනය කළ යුතු අතර ඔවුනට ගායනය සහ රංගනය යන දෙකෙහි ම දක්ෂතා තිබිය යුතු ය. අදහස් ප්‍රකාශනයේ දී ගීතය සමඟ රිද්මානුකූල චලන යොදා ගැනීම මෙහි දි දැකිය හැකි විශේෂත්වයකි. ගීත නාටකවලට උදාහරණ ලෙස ප්‍රේමසිරි කේමදාස මහතාගේ කැලෑමල් නාට්‍ය ද සරච්චන්ද්‍ර මහතාගේ පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය ද මකුලොළුව මහතාගේ දෙපානෝ නාට්‍යය ද දැක්විය හැකි ය. තාත්වික, ශෛලිගත, ගීත නාටක ආදී නාට්‍ය අතර මුද්‍රානාට්‍ය සුවිශේෂ කලා මාධ්‍යයකි.

මුද්‍රා නාට්‍ය

වාචික අභිනයෙන් තොර ව චලන මාධ්‍යයෙන් කිසියම් තේමාවක් පදනම් කොටගෙන නිර්මාණය කරන ලද මුද්‍රා මඟින් අදහස් ප්‍රකාශ කරන නාට්‍ය මුද්‍රා නාට්‍ය නමින් හඳුන්වයි. මෙහි දී සංගීතයට ප්‍රධාන තැනක් හිමි වන අතර කතා පුවතක් නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම දේශීය මුද්‍රා නාට්‍යවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ය. ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාවෙහි ප්‍රභවය කෙරෙහි සෘජු ව ම බලපා ඇත්තේ ඉන්දියානු නර්තන කලාව යි. නූතනයේ බටහිර මුද්‍රා නාට්‍යවල ආභාසයෙන් ඇතැම් ශිල්පීන් මුද්‍රා නාට්‍ය නිර්මාණය කර ඇති බව පෙනේ. 1936 ශාන්ති දේව ඝෝෂ් නිෂ්පාදනය කළ ''සීතාහරණ'' නම් මුද්‍රා නාට්‍ය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රානාට්‍ය ලෙස නම් කර ඇත.

## ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත මුද්‍රා නාට්‍ය

චිත්‍රසේන මහතා - කරදිය, නල දමයන්ති, චණ්ඩාලිකා, ශිව රංග
වජිරා මහත්මිය - හිම කුමාරි, රන් කිකිළි
ප්‍රේමකුමාර එපිටවල මහතා - සැලළිහිණි, පරෙවිය, ගමන
එස් පණීභාරත මහතා - සත් පත්තිනි, ග්‍රහ අපලය
ඉඹුල්ගොඩ මහතා - උදාව, රන්දද



මුද්‍රා නාට්‍යක අවස්ථාවක්

මුද්‍රා භාවිතයට වඩා ඉඟි යොදාගැනීම හා පසුබිම් ගීත භාවිත කිරීම නිසා දේශීය මුද්‍රා නාට්‍ය ඉඟි නළු යනුවෙන් ද හඳුන්වා ඇත.

කාර්ය පත්‍රිකාව

1. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. ස්වාභාවික සම්ප්‍රදායය ඉක්මවා යන නාට්‍ය ශෛලිය හඳුන්වන්නේ ....................................නාට්‍ය වශයෙනි.
   ii නාට්‍ය ධර්මීශෛලිය අනුව .................. ......................... ....................................යනුවෙන් නාට්‍ය ප්‍රභේද තුනකි.
   iii අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය ශෛලිය .......................................නමින් හැඳින්වේ.
   iv එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ......................................... ............................................ යන නාට්‍ය ශෛලිගත නාට්‍ය ගණයට අයත් වේ.
   v රංගනයේ යෙදෙන නළුනිළියන් විසින් ම දෙබස් ගායනා ඉදිරිපත් කෙරෙන නාට්‍ය. ...............................................නමින් හැඳින්වේ.
   vi දෙපානෝ නමැති ගීත නාටකය ..............................................................මහතාගේ නිර්මාණයකි.
   vii ශාන්ති දේව ඝෝෂ් නිෂ්පාදනය කළ .........................................නම් මුද්‍රා නාට්‍යය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍යය වේ.
   viii කරදිය මුද්‍රා නාට්‍ය.................................................මහතා විසින් නිර්මාණය කරන ලදි.

2. ඔබ කැමති නාට්‍යයක් කණ්ඩායම් වශයෙන් නිර්මාණය කර රඟ දක්වන්න.

# 7 පරිච්ඡේදය

## 7.1.1 ගීතයට සවන් දී එහි සුවිශේෂතා සාකච්ඡා කිරීම

**1. ගීතය - රන්වන් දුල් කරලින් පැසිලා.......**

චිත්‍රපටිය - මාතලන් 1955
පද රචනය - බෙනඩික් ප්‍රනාන්දු
සංගීතය - ආර් මුත්තුස්වාමි
ගායනය - ලතා වල්පොල

දිනිඳා උදය ගිර මුදුනින් නැග එනවා
සුරිඳා පිහිට යැද ගොවි කුඹුරට යනවා

රන්වන්දුල් කරලින් පැසිලා නැමිලා බර වීලා
තල වැවිලා රමණී සෝභා කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා හෝ කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා//

ඉග නලවා කපමු නෙලමු හො හෝ......යි.....යා//
මිටිබැඳලා හිස මත ගනිමු - යා..මු පෙළ සැදිලා...
යා..මු පෙළ සැදිලා... යා..මු පෙළ සැදිලා...
මිටිබැඳලා හිස මත ගනිමු - යා..මු පෙළ සැදිලා...
බට ලී සංගීතේ මතු ගවයො රැලේයා
ගොපලුන් හා මිහිරේ වෙලිලා - යාමු රංචු හෝ...යියා
හෝ යාමු රංචු හෝ...යියා, හෝ යාමු රංචු හෝ...යියා

රන්වන්දුල් කරලින් පැසිලා...............

මඳ සුළගේ කුල්ලෙන් පොළලා හො හෝ......යි.....යා//
තලවේලා බොල්පොතු හැරලා -කමතේපිරි ධාන්‍යා...
කමතේපිරි ධාන්‍යා... කමතේපිරි ධාන්‍යා...
තලවේලා බොල්පොතු හැරලා -කමතේපිරි ධාන්‍යා...
සැම දෙවියෝ පිහිටාධාරෙන්- කරුණාලැබීලා
ගමසාරයි - හාමත දුරුවෙයි
ගොවිසිත ප්‍රීති හෝයි...යා හෝ ගොවිසිත ප්‍රීති හෝයි...යා හෝ
ගොවිසිත ප්‍රීති හෝයි...යා

රන්වන්දුල් කරලින් පැසිලා...............

## 7.1.2 ගීතයට සවන් දී එහි සුවිශේෂතා සාකච්ඡා කිරීම

### ගීතය - රන්වන් දූල් කරලින් පැසිලා.......

කෘෂිකාර්මික ජන ජීවන රටාවක් ගත කරන ගැමි පරිසරයක ජීවත්වන ගොවියන්, ගෙවිලියන් තම කෘෂිකාර්මික ජීවිතයේ සිදු කරනු ලබන යම් යම් සංසිද්ධි කිහිපයක් ද සශ්‍රීකත්වය හා ඔවුන්ගේ ගැමි සංස්කෘතිය පිළිබඳව ද මෙම ගීතයෙන් අර්ථ ගැන්වේ.

ඒ සඳහා ගීත රචකයා ගැමි ජන වහරේ එන සරල බස්වහර කාව්‍යාත්මක ව ගළපා සහෘදයන් රසජනනය කරලීමට සමත් වී ඇත. ගීතයේ එන,

'ඉඟ නළවා කපමු, නෙළමු මිටි බැඳලා, හෝයියා යන වචන බලන්න. ඉඟ නළවා යන්නේ කාන්තාවන් ය. ගැමි ලියන්ගේ සුන්දරත්වය, සුකොමළ බව, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව තම කාර්යයෙහි නියැලෙන බව, සාමූහික ව ප්‍රීතිමත් ව කාර්යය කරන බව හැඟවීමට මෙම වචන යොදා ගෙන ඇති ආකාරය කොතරම් අගනේ ද? කෘෂි කර්මාන්තයේ මිටි බැඳලා යන්නෙන් අදහස් කෙරෙන්නේ ගොයම් කපා එය කොටස කොටස එකතු කර එකට සම ප්‍රමාණයෙන් ගැට ගසීමයි.

'මඳ සුළඟේ කුල්ලෙන් පොළලා හෝ....යි....යා

තල වැවිලා බොල් පොතු හැරලා' මෙවැනි වචන යොදා තිබීමෙන් කාර්ය රාශියක කාර්යක්ෂම බව කියාපායි. ධාන්‍ය වර්ග නෙළා ගත් පසු කාටුව බොල් පොතු සියල්ල ඉවත් කර ගත යුතු ය. ඒ සඳහා ධාන්‍ය හොඳින් වේළා ගත යුතු ය. තෙත් සහිත නම් සුළගේ පොළා බොල්පොතු ඉවත් කර නොහැකි ය. ගීත රචකයා සරල වචන කිහිපයක් යොදාගෙන එම කාර්යසියල්ල හුවා දැක්වීමට සමත් ව ඇත.

එසේ ම රංචුව, හාමත, කරුණා වැනි වචන යොදා ගෙන ගැමි පරිසරයක ඇති නිර්ව්‍යාජ බව පෙන්වාදීමට සමත් ව ඇත.

ගීතයක අර්ථය භාෂාව මෙන් ම එහි කලාත්මක පසුබිම පිළිබඳ විචාරාත්මක විග්‍රහයක රසවිඳීම මඟින් රසඥතාව වඩා වර්ධනය කරගත හැකි ය.

උදෑසන ම සූර්ය කුමරුන් ලොව බලද්දී දෙවිදේවතාවුන්ගේ පිහිට ආරක්ෂාව ලබන ගොවි රජු තම ජීවිතයේ ඉහළ ම රාජකාරිය ඉටු කර ගැනීමේ අරමුණින් කුඹුරට යයි. ඒ බව ගීතය ආරම්භයේ දී,

'දිනිඳා උදය ගිර මුදුනෙන් නැඟ එනවා

සුරිඳා පිහිට යැද ගොවි කුඹුරට යනවා' යන්නෙන් දැක්වේ. මෙයින් ගැමියා තුළ පවතින ආගමික භක්තිය ඇදහිලි හා විශ්වාස පැහැදිලි වේ. එසේ ම විලම්බ ලයට එය ගැයෙද්දී භක්තිමත් බව තව දුරටත් තීව්‍ර වේ.

ගීත රචකයා එසේ නිමවූ පදවැල් ගීතයේ තාලය හා ලය වෙනස් කරමින් (ද්‍රැත ලයට හා මාත්‍රා 2+2 තාලයට) ගයනු ලැබේ.

'රන්වන් දූල් කරලින් පැසිලා නැමිලා බරවීලා

තල වැවිලා රමණී සෝභා කෙත්වතු පිරිලා සාරා....'

ලෙස මිහිරි නදින් ගීත ගායනය ඇසෙන විට එහි රසය උද්දීපනය වේ.

තල කරල් රන්වන් පාටින් එකත්පසට බර වෙයි. එම ගොවිබිමෙහි තල වැවිලා ඇත. කෙත්වතු පිරී සාරවත් බවින් පරිපූර්ණ ය. මෙය රමණීය වූ දර්ශනයකි. චිත්ත රූප මැවෙන ආකාරයට ගීතයේ තාලය, ලය හා සංගීතය යොදා තිබීම ඉතා චමත්කාරජනක ය. එමෙන් ම ගීත ඛණ්ඩ නැවත නැවත ගායනා කිරීමෙන් ගීත රසය තීව්‍ර වේ.

'කෙත්වතු පිරිලා සාරා හෝ කෙත්වතු පිරිලා සාරා'

'ඉඟ නළවා කපමු නෙළමු//

මිටි බැඳලා හිස මත තබලා

යාමු පෙළ සැදිලා ///'

අස්වනුනෙළන අවස්ථාවන්ට ගොපලු දරුවන් සමඟ ගවයෝ රංචු ගැසී රළට යති. ගවයන් බට ලී මිහිරෙන් මත් වී යන බව ගීත රචකයා රසික හදවතට පවසයි.

ගොවි බිම ගොවියාට රන් බිමකි. තමා දුක් මහන්සි වී සියලු පල ලබා ගැනීමට යන මොහොතේ ගොවි සිත සතුටින් පිනා යයි. ප්‍රීතියෙන් උද්දාමයට පත් වෙයි. ඒ අවස්ථාව වචනයෙන් කියා නිම කිරීමට නොහැකි ය. ගැමි පරිසරයේ ඇති නිර්ව්‍යාජ බව ත් ඒ හා බැඳුණු සිරිත් විරිත් ආදියට පණ පොවන ගොවි රජාගේ හාමත දුරු වන්නේ වෙහෙස මහන්සියෙන් ලබාගන්නා අස්වැන්නෙනි. බොල් පොතු හැරලා ගත් ධාන්‍යවලින් කමත පිරී ඉතිරී ගොසිනි.

මේ ආකාරයට ගොවිබිම සරු අස්වැන්න ලබා ගැනීමට හිරු රජිඳාගේ හා දෙවියන්ගේ පිහිට ලැබ සාමූහික බවින් හා භක්තියෙන් යුතු ව තම ශ්‍රමයේ අග්‍රඵලය ලබාගන්නා ගොවි මහතාගේ සිත ප්‍රබෝධයට පත් ව පිරී ඉතිරී යන සතුටින් යුතු අවස්ථාව හැඟීමෙන් යුතු ව ප්‍රකාශ කරයි.

අර්ථ රසයට ශබ්ද රසය ද මනා ව ගළපා ගීතය පද රචනය කර ඇති අතර, එහි සංගීතය හා මිහිරි ගායනය සුසංයෝග කර සහෘද සිත් තුළ රසජනනය වර්ධනය කළ හැකි සාර්ථක නිර්මාණයකි.

2 ගීතය

**අක්කෙ අක්කෙ අර බලන්නකෝ**

පද රචනය :- ආනන්ද සමරකෝන්
සංගීතය :- ආනන්ද සමරකෝන්
ගායනය :- සූරිය ශංකර් මොල්ලිගොඩ
වී.පී. ලීලාවතී

එදිනෙදා ජීවිතයේ අත්දකින අවස්ථා අතර එක් සුවිශේෂ අවස්ථාවකි වැස්ස වැහැගෙන එන මොහොත. බොහෝවිට අවට වටපිටාව චමත්කර ජනක පරිසරය අප සිත තුළ මවා පායි. සමහර විටෙක සිත ප්‍රීතියෙන් පිනායද්දී තවත් විටෙක භයංකර සිතිවිලි මැවේ. එවැනි බියකරු අවස්ථාව හුවා දක්වමින් රචනා කරන ලද භාවපූර්ණ ගීතයක් ලෙස මෙම ගීතය දැක්විය හැකි ය.

මෙහි යොදාගෙන ඇති භාෂාව සරල ය. කෙටි වැකි යොදාගෙන ගීතය අර්ථගන්වා රසවත් ව ඉදිරිපත් කර ඇත. වැස්ස එන මොහොතේ ඉතා ම කලබලකාරී කාර්යබහුල බවක් දක්නට ඇත. දර ටික තෙමුණොත් උයා පිහා ගැනීමට හැකියාවක් නැත. ඒ නිසා දර ටික ඉක්මනින් ගෙට ගැනීම ට වතුර ඉවර වී ඇති බැවින් කළගෙඩියට වතුර ගෙන ඒමට දෙදෙනා ම යමු යැයි පවසන්නේ ඉහත සඳහන් කළ දෑ අර්ථ ගන්වමිනි.

හෝ හෝ හෝ ගාගෙන එන්නේ වැනි අනුප්‍රාසය දක්වෙන බස් වහරක් යොදාගෙන ඇත්තේ ශබ්ද රසය මඟින් අර්ථ රසය ඉස්මතු කරලීමට ය. එමෙන් ම අවස්ථානුකූල ව භාවාත්මක සිතුවිලි ඉස්මතු කරමින් සංයමයෙන් යුතු ව බස හසුරුවා ඇති බව පෙනෙනන් ට තිබෙන කාරණයකි.

'අක්කෙ අක්කෙ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ
හෝ..හෝ..හෝ..ගා ගෙන එන්නේ
ගස්වැල් පෙරළෙන්නේ...'

මේ අවස්ථාවේ නිවසේ ඇතිවන සංවාදය පාදක වන්නේ වැස්ස එන්නට සැරසෙන ආසන්න පරිසරයේ සිදුවන සිදුවීම් ය.

'සුළං තද යි - විදුලිය ද කොටයි
හෙණ හඬ පැතිරෙයි - මහ වලාකුළක් මේ එන්නේ'

සුළං හැමීමත් සමඟ ම විදුලි කොටා හෙණ හඬ මුළු පරිසරය පුරාවට ම පැතිරීමේ භයංකාර බව තව දුරටත් සිත තුළ ජනිත කරවීමට සමත් වේ.

එසේ ම වැස්සට පෙර සූදානම මෙම ගීතයේ කැපී පෙනේ. මවත් පියාත් නොමැති අවස්ථාවේ ගෙදර වගකීම් දරන වැඩිමහල් දුවට බාල සහෝදරයා ආමන්ත්‍රණය කරන ආකාරය ඉතාමත් අගය කළ යුතු ය. එය ගීතය පුරාවට විහිදී යයි. පවුලේ සමඟිය, සාමූහික බව, ආදරය පිළිබිඹු වන ආකාරයට ගී පදවැල් අමුණා ඇත.

'අක්කේ වී පැදුරත් මිදුලේ හකුළා ගෙට ගනිමු'
'අක්කේ දර ටික ගෙට ගනිමු'

යනුවෙන් අක්කාට ආමන්ත්‍රණය කරන්නේ බොහෝ ළෙන්ගතුකමිනි. එසේ ම වතුර ගෙන එන්නට අක්කා සමඟ ළිඳට යමු යැයි පවසන්නේ කියාපාමිනි. වැස්ස එන වේලාවේ මල්ලි තාම කුඹුරේය.

යනුවෙන් අක්කාට ආමන්ත්‍රණය කරන්නේ බොහෝ ළෙන්ගතුකමිනි. එසේ ම වතුර ගෙන එන්නට අක්කා සමඟ ළිඳට යමු යැයි පවසන්නේ සාමූහික බව කියාපාමිනි. වැස්ස එන වේලාවේ මල්ලි තාම කුඹුරේය ඔහු නොඑන නිසා එයද හිතට බිය ගෙනදෙන කරුණකි.

නංගී බියෙන් හඬන්නේ ගෙරවිලි හඬ බිල්ලන් යයි සිතාගෙන සහ මව නැති ශෝකයෙනි.

නංගි සුදෝ මගෙ අඬන්නෙපා
අම්ම හණික දූන් එයි
බිල්ලො නොවෙයි ඔය ගොරවන්නේ
අහසේ හෙන නාදේ. ලෙස පවසමින් ඇය නළවා ගන්නට දරණ උත්සාහය,ආදරය, සෙනෙහස මතුකොට දක්වයි .

මෙම ගීතය මාත්‍රා 4 තාලය අනුව මධ්‍ය ලයට ගායනා කරන අතර අවස්ථාවට උචිත පරිදි රසික සිත් තුළට බිය මුසු බව,කඩිසර ගතිය,ලෙන්ගතු බව ගැඹුරින් දැනෙන පරිදි හා චිත්ත රූප මැවෙන පරිදි රචනා කරන ලද ගීතයකි.

## 7.2 ගීතයට අනුව නර්තන නිර්මාණය

7.1 පාඩමෙන් දක්වන ලද ගීතවලින් එක් ගීතයකට අනුව නර්තන නිර්මාණය කිරීම මීළඟ අරමුණ යි. ගීතයකට නර්තන නිර්මාණය කිරීමේ දී තෝරාගත් ගීතය කිහිප වරක් ශ්‍රවණය කර එහි අර්ථය, තාලය, භාවය ආදි අන්තර්ගත ලක්ෂණ හා සංගීතය යොදා ඇති ආකාරය පිළිබඳ ව අවබෝධ කරගත යුතු ය. ඒ සඳහා 7.1 පාඩමේ දක්වා ඇති කරුණු පිටිවහලක් කර ගත හැකි ය.

ගීතයට සුදුසු චලන නිර්මාණය කරගත හැකි ආකාරය සිතා බලන්න. ගීතයේ තාලය රිද්මය මෙන් ම අදහස් ප්‍රකාශනය වන පරිදි චලන ගොඩ නගා ගත යුතු ය. එපමණක් නොව ගීත දෙකෙහි ම යොදා ගෙන ඇති භාෂාව මඟින් අර්ථ ප්‍රකාශ වන බව පෙනේ. ගීත අනුව නර්තන නිර්මාණයේ දී ආංගික අභිනය යොදා ගැනීම ඉතා වැදගත් කොට සැලකිය හැකි ය. ශරීරයේ අංග ප්‍රත්‍යාංග හා උපාංග භාවිත කරගනිමින් චලන ගොඩනගා ගැනීමට උත්සාහ කළ යුතු ය.

ගීතයෙන් දැක්වෙන ප්‍රීතිය, සතුට, භය, ශෝකය වැනි කවර හෝ අදහසක් වුව ද අංග චලන සමඟ ඇස, ඇහිබැම, කම්මුල්, තොල්, නළල ආදි ප්‍රත්‍යංග භාවිත කොට දැක්වීමෙන් නර්තනයේ ප්‍රාසංගික ගුණය වර්ධනය කරගත හැකි ය.

මෙහි දැක්වෙන රන්වන් දුල් කරලින් පැසිලා... යන ගීතයේ අර්ථ විග්‍රහයෙන් දැක්වෙන්නේ ගොවි බිමක අසිරිය යි. ගොවියෝ, ගෙවිලියෝ, ගොවි දරු වන් මෙහි ජීවත් වන චරිත යි. ඔවුන්ගේ වෘත්තිය හා බැඳි ක්‍රියාවන් කිහිපයක් මෙම ගීතය තුළ දක්නට ලැබේ.

නර්තන නිර්මාණ ක්‍රියාවලියේ දී එම ක්‍රියාකාරකම් පිළිබඳ හොඳින් නිරීක්ෂණය කර ලබාගන්නා දැනුම ඉතා වැදගත් ය. මෙම ගීතයේ දැක්වෙන අවස්ථා අතර එක් අවස්ථාවක් ලෙසට තල කැපීමේ අවස්ථාව උදාහරණයක් වශයෙන් ගනිමු. මෙහිදී තල කැපිය යුත්තේ කෙසේ ද, එවිට ශරීරයේ ඉරියව් පිහිටන්නේ කෙසේ දැයි සිතා බැලිය යුතු ය. තල ගස් අතින් අල්ලා ගන්නා ආකාරය
දෑකැත්ත අල්ලා ගන්නා ආකාරය තල කැපීම සඳහා වැය කරන කාලය, ශක්තිය, ජවයත් එහිදී ශරීරාංගවල හැඩය පිහිටීම හා ගති ලක්ෂණ පිළිබඳ ව අවබෝධයක් ලබාගත යුතු ය. ඒ අනුසාරයෙන් චලන ගොඩ නගා ගැනීමෙන් නිර්මාණය සාර්ථක කරගත හැකි ය. එසේ ගොඩනගා ගත් තාලානුකූල, රිද්මානුකූල, ප්‍රකාශනාත්මක චලන යොදා සමස්ත ගීතයට නර්තන නිර්මාණය කරගත හැකි ය.

**ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු**

1. ගීතය හොඳින් කිහිප වරක් ශ්‍රවණය කර එහි අර්ථය වටහා ගැනීම
2. ගීතයේ තාලය, රිද්මය, ප්‍රකාශනය හා ලය පිළිබඳ ව අවබෝධ කරගැනීම
3. ඒ අනුව සුදුසු චලන ගොඩනැඟීම, මේ සඳහා සාම්ප්‍රදායික නර්තන ඇසුරින් නිර්මාණය කරගත් අලංකාර මාත්‍රා හා නිදහස් චලන යොදාගත හැකි ය.
4. ගොඩ නගා ගත් චලන යොදා ගනිමින් නර්තන අංගයක් නිර්මාණය කිරීම
5. තල, දිසා, රටා හා අවකාශය නිසි ලෙස භාවිත කරමින් නිමාවක් සහිත ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කිරීම

# 7.3 සරල රංග උපකරණයක් නිර්මාණය

### හැඳින්වීම

ගෘහස්ථ කටයුතුවල දී මෙන් ම කෘෂිකාර්මික කටයුතුවල දී ද භාවිත කෙරෙන උපකරණ ලෙස කුල්ල, දෑකැත්ත හා මෝල්ගස හැඳින්විය හැකි ය. වී පෙළීම සහල් පෙළීම වැනි කටයුතු මෙන් ම කමතෙහි දී බැත එකතු කොට කාටුව ඉවත් කිරීම සඳහා හුළං කිරීම වැනි කටයුතු සඳහා කුල්ල යොදා ගන්නා අතර ගොයම් කැපීම සඳහා දෑකැත්ත භාවිත කරති. වී ඇතුළු ධාන්‍ය වර්ග කෙටීම සඳහා යොදා ගනු ලබන්නේ මෝල් ගස ය.

### කුල්ල නිර්මාණය

බොහෝ විට කාන්තාවන් පරිහරණය කරන උපකරණයක් ලෙස කුල්ල හැඳින්විය හැකි ය. කුල්ලෙහි ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය කවරේ ද යි විමසා බැලීම සඳහා පළමුව මෙහෙය විය හැකිය. සාකච්ඡා මඟින් මතුවූ අදහස් අනුව සුදුසු අමු ද්‍රව්‍ය

කවරේ දැයි තීරණය කළ හැකි වේ.



යොදාගත හැකි අමුද්‍රව්‍ය

කොළපත්
කාඩ්බෝඩ්
බ්‍රිස්ටල් බෝඩ්
වර්ණ කඩදාසි

ආදි වශයෙන් සුදුසු අමුද්‍රව්‍ය යොදාගත හැකි ය.

තෝරාගත් අමුද්‍රව්‍ය අවශ්‍ය පරිදි සකසා ගැනීම ඊ ළඟ පියවර යි. කණ්ඩායම් කීපයකට වෙන් කොට එකී කාර්ය පැවරිය හැකි ය. අනතුරු ව කළ යුත්තේ ආකෘතිය සැලසුම් කිරීම යි. ආකෘතිය සැලසුම් කිරීමෙන් පසු අදාළ කොටස් නිර්මාණය කිරීම සඳහා යොමු කළ හැකි ය. එහෙත් රංග උපකරණය නිර්මාණය කළ යුත්තේ සාමූහික ක්‍රියාවලියක් වශයෙනි.

නිර්මාණය කරන ලද රංග උපකරණ සඳහා යොදාගත් අමුද්‍රව්‍ය ඒවා හසුරුවා ඇති ආකාරය හා නිර්මාණයේ සාර්ථකත්වය පිළිබඳ අදහස් දැක්වීම අනතුරු ව කළ හැකි ය. පහත දැක්වෙන්නේ ඒ සඳහා යොදාගත හැකි ඇගයීම් ක්‍රියාවලියකි.

**කාර්ය පත්‍රිකාව**

1. රංග උපකරණය නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගත් අමුද්‍රව්‍ය සඳහන් කරන්න.
2. එකී අමුද්‍රව්‍ය සුදුසු පරිදි සකස් කරගත් ආකාරය විස්තර කරන්න.
3. මූලික සැකැස්ම සකස් කළ අයුරු පැහැදිලි කරන්න.
4. රංග උපකරණය නිර්මාණය කළ ආකාරය හා එහි සාර්ථකත්වය අගයන්න.

## දැකැත්ත නිර්මාණය

දැකැත්ත ගොයම් කැපීම සඳහා යොදා ගන්නා උපකරණයකි. දැකැත්තෙහි ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය කවරේ ද යි පළමුව තීරණය කළ යුතු ය. ඒ සඳහා සාකච්ඡාවක් පැවැත්වීම වඩාත් සුදුසු ය. මෙහි දී විවිධ අදහස් මතුවිය හැකි බැවින් එකී අදහස් සමාලෝචනය කිරීමෙන් පසු සුදුසු අමුද්‍රව්‍ය කවරේ ද යි තීරණය කළ හැකි වේ.



යොදාගත හැකි අමුද්‍රව්‍ය

කාඩ්බෝඩ්
හාර්ඩ්බෝඩ්
බෙලෙක් තහඩු
වර්ණ කඩදාසි

අදි වශයෙන් සුදුසු අමුද්‍රව්‍ය යොදාගත හැකි ය.

පළමුව කළ යුතු වන්නේ හඳුනාගත් අමුද්‍රව්‍ය ඇසුරින් දැකැත්තේ ආකෘතිය නිර්මාණය කරන අයුරු පැහැදිලි කිරීම යි. ආකෘතිය සැලසුම් කිරීමෙන් පසු නිර්මාණ කාර්යය සඳහා යොමු විය හැකි ය. මෙය සාමූහික ව කළ හැකි ක්‍රියාවලියකි.

නිර්මාණය කරන ලද රංග උපකරණ පිළිබඳ අගයමින් අදහස් දැක්වීම අනතුරු ව කළ හැකි ය.

**කාර්ය පත්‍රිකාව**

1. රංග උපකරණ නිර්මාණය කිරීම සඳහා සුදුසු අමුද්‍රව්‍ය නම් කරන්න.
2. මූලික සැකැස්ම සකස් කළ අයුරු විස්තර කරන්න.
3. රංග උපකරණය නිර්මාණය කළ අයුරු පැහැදිලි කරන්න.

## මෝල් ගස නිර්මාණය

මෝල් ගස භාවිත කරන්නේ වී ඇතුළු ධාන්‍ය වර්ග කෙටීම සඳහා ය. මෝල් ගසෙහි ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගතහැකි අමුද්‍රව්‍ය කවරේ ද යි තීරණය කිරීම සඳහා සාකච්ඡාවක් පැවැත්විය හැකි ය. සාකච්ඡා ව මඟින් මතු වන කරුණු අනුව සුදුසු අමුද්‍රව්‍ය කවරේ දැයි තීරණය කළ හැකි වේ.

රෙදි ඔතන බම්බු
එස්ලෝන් බට
වර්ණ කඩදාසි

ආදි වශයෙන් සුදුසු අමුද්‍රව්‍ය යොදාගත හැකි ය.

අනතුරු ව කළ යුතු වන්නේ ආකෘතිය සැලසුම් කිරීම යි. ආකෘතිය සැලසුම් කිරීමෙන් නිර්මාණ කාර්යයට යොමු විය හැකි ය. මෙය සාමූහික ව කළ හැකි ක්‍රියාවලියකි.

නිර්මාණය කරන ලද රංග උපකරණය පිළිබඳ අගයමින් අදහස් ප්‍රකාශ කිරීම අනතුරු ව කළ හැකි ය. එසේ කළ හැක්කේ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙනි.

**කාර්ය පත්‍රිකාව**

1. රංග උපකරණය නිර්මාණය කිරීම සඳහා යොදාගත් අමුද්‍රව්‍ය සඳහන් කරන්න
2. එකී අමුද්‍රව්‍ය හසුරුවා ඇති ආකාරය පැහැදිලි කරන්න.
3 රංග උපකරණය නිර්මාණය කළ අයුරු විස්තර කරන්න.

# 8 පරිච්ඡේදය

## 8.1 ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීමේ වටිනාකම

මිනිසා තුළ නිතැතින් ම ඇති වන ශාරීරික තත්ත්වයන් ඉක්මවා ගොස් මානසික, ශාරීරික, අධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඇතුළත් වන සංසිද්ධි ස්වස්ථතාව යනුවෙන් හැඳින්විය හැකි ය. යම් පුද්ගලයකුගේ සිතිවිලි අනුව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් චිත්තවේගී ප්‍රකාශන සහ චර්යා රටා ගැඹුරින් නිරීක්ෂණය කිරීම තුළින් ඔහුගේ මානසික ස්වස්ථතාව අවබෝධ කරගත හැකි ය. ස්වස්ථතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙකකි.

1. මානසික සාධක
2. කායික සාධක

**මානසික සාධක :-** නිරෝගි මනසක් ඇති වන්නේ නීරෝග ශරීරයක් තුළ ය. මානසික ස්වස්ථතාව සඳහා මානසික නිරෝගී භාවය වඩාත් වැදගත් වේ. අද්‍යතනයේ ජීවත්වන බොහෝ පිරිස් කාර්ය බහුලත්වයෙන් පෙළෙන බැවින් මානසික පීඩනවලට ලක් වී ඇත. එය සමාජීය පැවැත්මට විශාල බාධාවක් ව පවතී. එමෙන් ම මනස නිරෝගීව තබා ගැනීම සඳහා පහත කරුණු බලපානු ඇත.

- තමා ජීවත්වන පරිසරය
- අන්තර් පුද්ගල සම්බන්ධතා
- චිත්තවේගවල සමබරතාව
- අධික මානසික පීඩන
- දෛනික ක්‍රියාකාරකම් පිළිවෙළ

මානසික ආශ්වාදය හෙවත් තෘප්තිය ළඟා කරගැනීම සඳහා සැම කෙනෙකුට ම සෞන්දර්යය උපකාරී වේ.

**කායික සාධක :-** නිරෝගී ශරීරයක් පවත්වාගෙන යාමට මානසික ස්වස්ථතාව සෘජු ලෙස බලපානු ඇත. ශරීරයේ නම්‍යශීලීත්වය හා හෘදය නිසිලෙස පවත්වාගෙන යාම, අස්ථිවල ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාම, මාංසපේශිවල ක්‍රියාකාරිත්වය හා සමබරතාව ආරක්ෂා කරගැනීම කායික වශයෙන් බලපාන ප්‍රබල සාධක ලෙස දැක්විය හැකි ය.

**ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා නර්තනයේ වැදගත්කම**

නර්තනය ශාරීරික මානසික සුවය සඳහා මිනිසුන් යොදාගෙන ඇත්තේ මීට ශතවර්ෂ 4කට පමණ පෙර සිට ය. වසංගත රෝග, දරුගැබ් ආරක්ෂා කිරීම, දරුවන් නොමැතිකම උදෙසා අතීතයේ සිට ශාන්තිකර්ම පවත්වා ඇත. මානසික ස්වස්ථතාව සඳහා යෙදා ගන්නා දේශීය ශාන්තිකර්ම ඊට හොඳ ම නිදසුන් ය.

ශරීරයේ ඇති වන ලෙඩරෝග වන දියවැඩියාව අධික තරබාරු කම, අධිරුධිර පීඩනය වැනි රෝගාබාධ මෙන් ම ආතතිය නිසා ඇති වන මානසික ලෙඩ රෝග දුරු කර ගැනීම සඳහා ක්‍රීඩාව මෙන් ම නර්තනය හා සංගීතය ඉවහල් වන බව පිළිගත් මතයකි. දාර්ශනිකයකු වන ප්ලේටෝ නමැත්තා පවසන්නේ ක්‍රීඩාව, සංගීතය ඉගෙනීම ශාරීරික මෙන් ම මානසික සුවයට බලපාන බව යි .

අද්‍යතන ලෝකයේ බොහෝ රටවල නර්තන චකිත්සා හා සංගීත චකිත්සා බොහෝ දෙ න කු තම ශරීර සුවතාව සඳහා යොමු වෙති. සංගීතයට අනුව චලන ක්‍රියාකාරකම්වල යෙදී ම වැදගත් වේ. ඒ තුළින් සමාජ සම්බන්ධතා මෙන් ම සංස්කෘතික හුවමාරු ද සිදු වෙයි. සංගීතය ශ්‍රවණය කිරීම මඟින් සිතෙහි ඇතිවන ආස්වාදය මානසික සුවයට හේතු වෙයි. එමෙන් ම ශරීර අභ්‍යාස සඳහා විවිධ චලන ක්‍රියාකාරකම්වල යෙදීම මඟින් ශරීරඅනවශ්‍ය මේදය, සීනි ඉවත් කර තරබාරුකම ඉවත ලමින් ශරීරයේ හෘදය ආරක්ෂා කරගැනීමට හැකි වේ. ඒ අනුව පහත සඳහන් කරුණු ජීවිතයට ඉතා වැදගත් වේ.

- පෙණහැල්ලේ ඇතිවන ශ්වසන අපහසුතා දුරු කිරීම
- ස්නායු හා අස්ථි මනා ලෙස ක්‍රියාකාරී වීම
- මාංසපේශීවල ක්‍රියාකාරිත්වය ශක්තිමත් වීම
- රුධිර ක්‍රියාකාරිත්වය සමබර වීම
- ශරීරයේ සමබරතාව ආරක්ෂා වීම

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


උඩරට නැටුම් කලාව -සේදරමන්, ජේ.ඊ.
ඇම්.ඩී. ගුණසේන සහ සමාගම
කොළඹ 1979

උඩරට වන්නම් දහඅට - විජේවර්ධන සරත්
ඇම්.ඩී. ගුණසේන සහසමාගම

උඩරට බෙර වාදන කලාව - බණ්ඩාර කරුණාරත්න
තරංගි ප්‍රිරින්ටස් 2000

පහතරට බෙර වාදනය කලාව - බණ්ඩාර කරුණාරත්න
තරංගි ප්‍රිරින්ටස් 2000

නර්තනයට අත්වැලක් - ජා.අ.ආ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
2000

සබරගමු නැටුම් කලාව -කේ.ඊ. සුසිලරත්න
සෙනරත් ප්‍රකාශන 2006

සිංහල නර්තන කලාව - දිසානායක, මුදියන්සේ
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
1998

භාරතීය සම්භාව්‍ය නර්තන කලාව - කෝට්ටෙගොඩ ජයසේන
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
1998

සංඛ විශේෂ කලාපය - ප්‍රකාශනය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
2004 සැප්තැම්බර්